වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළේ දේවවැදි හත්පත්තුවේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගල්වැව ගමෙහි පිහිටි “බෝගහමුල්ලවත්ත” නමැති ඉඩමට බලයලත් මානක ආරියදාස අතපත්තු විසින් මැන සාදන ලද අංක 136/2005 සහ 2005 අගෝස්තු මස 28 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද “ලොට් 1” ලෙස ලකුණු කොට ඇති ඉඩම් කොටස වන උතුරට : රන්නයිදේ උරුමකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටසින් ද, දකුණට : වෝල්ටර් සිල්වාට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ එකී අංක 136/2005 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි, පර්චස් විස්ස (අ. 0, රූ, 1, පර්. 20) ක විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී 1142/234 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-473/2

## මහජන බැංකුව - ලුණුගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සමම්ත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් සහතික කරන ලද 2007.05.08 වැනි දිනැති අංක 5161 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර සහ මාපා බණ්ඩාරලාගේ බලවර්ධන බණ්ඩා යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැදුම්කර අංක 5161 මත රුපියල් එක්ලක්ෂ හැත්තෑනවදහස් නවසිය පනස් හතරයි ශත විස්සක (රු. 1,79,954.20) මුදලක් දැනට එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑනවදහස් නවසිය පනස් හතරයි ශත විස්සක (රු. 1,79,954.20) මුදලක් සහ ඒ සමග එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑනවදහස් නවසිය පනස් හතරයි ශත විස්සක (රු. 1,79,954.20) මුදලක් මත 2008.07.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිහතරයි දශම පහ (24.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද සමග එකී මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරණු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලය ලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක යන අය විසින් එකී අංක 5161 දරන උකස් බැදුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කොට්ඨාසයේ, පට්ටිපොළ කෝරළයේ ලුණුගල අත්තනගොල්ල පිහිටි ලිඳකුඹුරවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටසකට මායිම් උතුරට : පිටතකුඹුරේ වත්තේ පැලඉණි වැට, නැගෙනහිරට : ගම් සභා පාර සහ පැල ඉණිවැට, දකුණට : මඩමට යන පාර සහ උඩුතුරේ ඇල, බස්නාහිරට : උඩුතුරේ ඇල සහ බෝගහගොඩේ ගල්වැටිය යන මායිම් තුළ පිහිටි අක්කර එකක් (අක් 01. රූඩ් 00, පර්. 00) වපසරියෙන් යුත් ඉඩම ගොඩනැගිලි වැවිලි ඇතුලු එහි පිහිටි සෑම සියලුදේත් සමග වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P32/194 යටතේ ලියාපදංචි කර ඇත.

පෙර කී ඉඩමට අවසරලත් මිනින්දෝරු ජී. සමරක්කොඩි යන අය මැන සෑදු 2007.01.18 දිනැති අංක 6011A දරන පිඹුරේ සලකුණු කොට ඇති පරිදි දැනට පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කොට්ඨාසයේ, පට්ටිපොල කෝරළයේ අත්තනගොල්ලේ පිහිටි “ලිඳකුඹුරවත්ත” යනුවෙන් හඳුන්වනු ලබන එකී අංක 6011A දරන පිඹුරේ කැබලි 1 වශයෙන් සළකුණු කොට ඇති බෙදා වෙන් කොට නිර්ණය කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පිට කුඹුරේ වත්ත වෙන් කරන පැල ඉණිවැට, නැගෙනහිරට : අඩි පාර දකුණට : අඩිපාර සහ උඩුතුරේ ඇල බස්නාහිරට : උඩුතුරේ ඇල සහ බෝගහගොඩේවත්ත වෙන් කරන ගල්වැට යන මායිම් තුළ පිහිටි අක්කර

එකක (අ. 0, රූඩ් 0, පර්. 0) වපසරියෙන් යුතු ඉඩම් කොටස ගොඩනැගිලි වැව්ලි ඇතුලු එහි පිහිටි සෑම සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාප සහකාර සාමාන්‍යාධිකාරී.
(ඌව)

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

04-445

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංක : 266379, 315044 සහ 327789.

2008 දෙසැම්බර් මස 02 වැනි දින පවත්වනලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2005 ඔක්තෝබර් මස 26 වැනි දින සහතික කරන ලද අංක : 1282 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගඟබඩ කංකානම්ගේ අනුර පියල් ගුණරත්න විසින් පැහැරහැර ඇති හෙයින් මෙහි (1 වැනි උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම) ද,

එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2005 ඔක්තෝබර් මස 26 වන දින හා අංක 1281 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2006 ඔක්තෝබර් මස 12 වැනි දින සහතික කරන ලද අංක 1735 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූද, බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගඟබඩ කංකානම්ගේ අනුර පියල් ගුණරත් විසින් පැහැර හැර ඇති හෙයින් මෙහි (2 වන උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම) ද,

එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2006 අගෝස්තු මස 17 වැනි දින සහතික කරන ලද අංක 1654 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2006 අගෝස්තු මස 28 වන දින සහතික කරන ලද අංක 1671 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී) හි නමට ලියන ලද්දාවූද බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගඟබඩ කංකානම්ගේ අනුර පියල් ගුණරත්න විසින් පැහැර හැර ඇති හෙයින් මෙහි (3 වන උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම) ද,

ඉහතකී බැඳුම්කර යටතේ රුපියල් අසූඑක් ලක්ෂ දෙදහස් නවසිය හැත්තෑ දෙකයි ශත එකොළහක (රු. 81,02,972.11) මුදලක් 2008 ජූලි මස 21 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අසූඑක් ලක්ෂ දෙදහස් නවසිය හැත්තෑ දෙකයි ශත එකොළහ (රු. 81,02,972.11) මුදලට 2008 ජූලි මස 22 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් තිස් ලක්ෂ අසූහය දහසක (රු. 30,86,000) මුදල මත 6% ක වැඩිදුර වාර්ෂික පොලිය සහ රු. 38,53,876.86 ක මුදල මත 15.5% වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1281, 1282, 1735, 1654 සහ 1671 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රයන් කොළඹ 12, හල්ප්ස්ඩොර්ප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### 1 වැනි උපලේඛනය

1. ගෝවින්න බලයලත් මානක පී. ඩී. ගුණසේකර විසින් 1994 මැයි මස 2 වැනි දින සාදන ලද අංක : 735 ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව හික්කඩුවේ පිහිටි රජ්ජුරුවෙවත්ත හෙවත් ගුඩඋඩවත්ත කියන ඉඩමේ භූමිය, ගසකොල, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන්කරන ලද ලොට් 13 දරන ඉඩම් කොටසට මායිම් : උතුරට සහ නැගෙනහිරට : ගංගාවද, දකුණට : හෙට්ටිගොඩ සිට ඇති අඩි පාරද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 12 ද, යන මායිම් තුල අංක 735 ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි රූඩ් එකයි පර්චස් පහයි දශම නවයයි අටක් (අ. 0, රූ. 1, පර්. 5.98) හෝ හෙක්ටයාර් 0.1163 විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 800/166 යටතේ ලියාපදිංචිව ඇත.

2. එකී අංක : 735ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි එකී හික්කඩුවේ පිහිටි රජ්ජුරුවෙවත්ත හෙවත් ගුඩඋඩවත්ත කියන ඉඩමේ භූමිය, ගසකොල, වගාවන් සහ සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 14 දරන ඉඩමට මායිම් : උතුරට : අඩි පාරද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 15 ද, දකුණට : ගංගාවද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 9 ද, යන මායිම් තුල අංක 735 ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම පහයි හතක් (අ. 0, රූ. 1, පර්. 0.57) හෝ හෙක්ටයාර් 0.1026 විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 800/166 යටතේ ලියාපදිංචිව ඇත.

එකී ලොට් 14 පෙර මෙසේ විස්තර කොට ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එච්. බී. ගුණවර්ධන විසින් 1942 මැයි මස 22 වන දින සාදන ලද අංක : 2004 ඒ දරන පිඹුර පරිදි එකී හික්කඩුව පිහිටි රජ්ජුරුවෙවත්ත හෙවත් ගොඩඋඩවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 14 දරන ඉඩමට මායිම් : උතුරට : ඒබ්‍රහම් ගුණතිලකට අයිති එම ඉඩමේ කොටසක්ද, නැගෙනහිරට : හෙට්ටිආරච්චි ලෝරාට අයිති එම ඉඩමේ කොටසක්ද, දකුණට : ගංගාවද, බස්නාහිරට : කේ. ජී. ප්‍රැන්සිනාට අයිති එම ඉඩමේ ලොට් 9 ද, යන මායිම් තුල අංක : 2004 ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම පහයි හතක් (අ. 0, රූ. 1, පර්. 0.57) හෝ හෙක්ටයාර් 0.1026 විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 800/167 යටතේ ලියාපදිංචිවී ඇත.

ඉහත කී අංක : 735ඒ දරන පිඹුරේ පෙන්වා ඇති අඩි පාර ඔස්සේ ගමන් කිරීමේ අයිතිය සහ මේ යටතේ ඇති වෙනත් මාර්ග ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

### 2 වැනි උපලේඛනය

1. බලයලත් මානක පී. එච්. ජී. ඒ. ඒ ද සිල්වා විසින් 2004 ජනවාරි මස 16 වැනි දින සාදන ලද අංක : 2597 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ ලොට් 4හි ලොට් 02 ද, ලොට් 02හි ලොට් 2 ඒ ද වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ ලොට් 4 රේ ලොට් 01 ද, ලොට් 01හි ලොට් 01 බී ද, යන යාබද සහ ඒකාබද්ධ ඉඩම් 2 හි නැවත බෙදීමක් වන භූමිය, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන කොටසට මායිම් :- උතුරට : එම ඉඩමේ ලොට් 04හි ලොට් 01 ද, ලොට් 01හි ලොට් 01 ඒ ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : අංක 2597 දරන පිඹුරේ පාරක් සඳහා පෙන්වා ඇති ලොට් 05 සහ එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 03 ද, බස්නාහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 03 ද, යන මායිම් තුළ එකී අංක 2597 දරන පිඹුර පරිදි පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) හෝ හෙක්ටයාර් 0.04302 විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 791/139 යටතේ ලියාපදිංචි ව ඇත.

බලයලත් මානක පී. එච්. පී. ඒ. ඒ. ද සිල්වා විසින් 2004 ජනවාරි මස 16 වැනි දින සාදන ලද අංක 2596 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 2බී සහ එකී අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 5 ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

2. ඉහත කී අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව හික්කඩුවේ වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ ලොට් 04හි ලොට් 02 ද, ලොට් 02හි ලොට් 2 ඒ දරන වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 ද, ලොට් 01 කේ ලොට් 1 බී ද, කියන යාබද සහ ඒකාබද්ධ ඉඩම් 2 හි නැවත බෙදීමක් වන භූමිය, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 03 දරන කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 04හි ලොට් 01 හි ලොට් 01 ඒ ද, නැගෙනහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 10ක් පළල පාරක් සඳහා) වෙන් කරන ලද ලොට් 04 සහ ලොට් 05 ද, දකුණට : අංක 2597 දරන පිඹුරේ (පාරක්) සඳහා පෙන්වා ඇති ලොට් 05 ද, බස්නාහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 02 ද, යන මායිම් තුළ එකී අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 15.50) හෝ හෙක්ටයාර් 0.03922 විශාල ඉඩම. ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 784/212 යටතේ ලියාපදිංචිව ඇත.

### 3 වැනි උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව, හික්කඩුව වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ ලොට් 04හි ලොට් 2 හි ලොට් 2 ඒ දරන සහ වැවල මුත්තෙට්ටුවෙල ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 ද, ලොට් 01 හි ලොට් 1 බී දරන යාබද සහ ඒකාබද්ධ ඉඩම් දෙකෙහි නැවත බෙදීමක් වන භූමිය, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 04හි ලොට් 01 හි ලොට් 01 ඒ සහ අංක . 2597 දරන පිඹුරේ ලොට් 02 ද, නැගෙනහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 10 ක් පළල පාරක්) සඳහා වෙන් කොට ඇති ලොට් 02 සහ 05 ද, දකුණට : අංක 2596 දරන පිඹුරේ පෙන්වා ඇති (පාරක්) සඳහා වෙන් කරන ලද ලොට් 02 හි ලොට් 2 බී සහ අංක 2597 දරන පිඹුරේ (අඩි 10 ක් පළල පාරක් සඳහා) වෙන්කොට ඇති ලොට් 05 ද, බස්නාහිරට : අංක 2596 දරන පිඹුරේ (පාරක්) සඳහා වෙන්කොට ඇති ලොට් 02 හි ලොට් 2 බී ද, යන මායිම් තුළ අංක 2597 දරන පිඹුර පරිදි පර්චස් දාහතරයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 14.70) හෝ හෙ. යා. 0.03720 විශාල ඉඩම වේ.

2. එකී වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල ඉඩමේ ලොට් 04හි ලොට් 02 ද, ලොට් 02 හි ලොට් 2 ඒ සහ වැවල මුත්තෙට්ටුවෙල ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 ද, ලොට් 01 හි ලොට් 1 බී දරන යාබද සහ ඒකාබද්ධ ඉඩම් දෙකෙහි නැවත බෙදීමක් වන භූමිය, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන්කරන ලද ලොට් 2 දරන ඉඩමට මායිම් :- උතුරට : එම ඉඩමේ ලොට් 04හි ලොට් 01 හි ලොට් 1 ඒ ද සහ අංක 2597 දරන පිඹුරේ ලොට් 03 ද, නැගෙනහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 10 ක් පළල පාරක්) සඳහා වෙන් කර ඇති ලොට් 03 සහ ලොට් 05 ද, දකුණට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 01 සහ (පාරක් සඳහා) වෙන් කරන ලද ලොට් 05 ද, බස්නාහිරට : අංක 2597 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 01 ද, යන මායිම් තුළ අංක 2597 පිඹුර පරිදි පර්චස් පහළොවයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 15.10) හෝ හෙක්ටයාර් 0.03821 විශාල ඉඩම. බලයලත් මානක පී. එච්. ජී. ඒ. ඒ. ද සිල්වා විසින් 2004 ජනවාරි මස 16 වැනි දින සාදන ලද එකී අංක. 2596 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 2 බී හා අංක 2597 දරන පිඹුරේ අංක 5 ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

පහත සඳහන් ලොට් 01 සහ ලොට් 02 දරන ඉඩම් දෙක යාබද සහ ඒකාබද්ධ ඉඩමේ නැවත බෙදීමක් වේ.

බලයලත් මානක පී. එච්. පී. ඒ. ඒ. ද සිල්වා විසින් 2004 ජනවාරි මස 16 වැනි දින සාදන ලද අංක 2596 දරන පිඹුර පරිදි එකී වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 04හි ලොට් 2හි ලොට් 2ඒ දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 04හි ලොට් 01හි ලොට් බී ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : ලොට් 04හි ලොට් 03 ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 04හි ලොට් 02හි ලොට් 2බී ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිහයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 1, පර්. 30.25) හෝ හෙක්ටයාර් 0.1777 විශාල ඉඩම වේ

එකී ලොට් 2ඒ පහත දක්වා ඇති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

1. බලයලත් මානක එම්. ඩබ්ලිව්. ෆොන්සේකා විසින් 1950 දෙසැම්බර් මස 06 වැනි දින සාදන ලද අංක 675 දරන පිඹුර පරිදි එකී වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 04හි ලොට් 2 දරන ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 01 ද, ඊසාන දිගට : ඇලද, දකුණට සහ ගිණිකොන දිගට : එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 03 ද, නිරිත දිගට : දඹගහවත්තද, වයඹ දිගට : එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 ද, යන මායිම් තුළ අංක 675 දරන පිඹුර පරිදි රූඩ් එකයි පර්චස් තිස්පහයි දශම තුනයි තුනක් විශාල ඉඩම. ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 784/138 යටතේ ලියාපදිංචිව ඇත.

එකී වැවල පිහිටි වැවල මුත්තෙට්ටුවෙල ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 04 රේ ලොට් 01 හි ලොට් 1 බී දරන ඉඩමට මායිම් : උතුරට : එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 හි ලොට් 1 ඒ ද, නැගෙනහිරට : ඇලද, දකුණට : එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 02 හි ලොට් 2 ඒ ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 04 රේ ලොට් 01 හි ලොට් 01 ඒ ද, යන මායිම් තුළ පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 03) හෝ හෙක්ටයාර් 0.00759 විශාල ඉඩම. අංක 2596 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 784/203 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-477

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය : පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 251557.

2008 දෙසැම්බර් මස 2 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. පී. එස්. බාලසූරිය විසින් 2003 ඔක්තෝබර් මස 06 වැනි දින සහතික කරන ලද අංක 23 ද, කොළඹ ප්‍රසිද්ධ නෙතාරිස් ඩබ්ලිව්. එෆ්. ඊ. එස්. පර්නැන්ඩු විසින් 2003 ඔක්තෝබර් මස 31 වැනි දින සහතික කරන ලද අංක 3100 ද, 2004 ජනවාරි මස 19 වැනි දින සහතික කරන ලද අංක 3179 සහ 2004 ජූලි මස 1 වැනි දින සහතික කරන ලද අංක 3307 ද, දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෂාහුල් හමීඩ් මොහමඩ් හජීල් ණයකරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන් මිලියන හයසිය තිස්තුන් දහස් තුන්සිය තිස් එකයි ශත හතලිස් නවයක (රු. 3,633,331.49) මුදලක් 2008 අගෝස්තු මස 18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් තුන් මිලියන හයසිය තිස්තුන් දහස් තුන්සිය තිස් එකයි ශත හතලිස් නවයක (රු.3,633,331.49) මුදලට 2008 අගෝස්තු මස 19 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,350,000 ක මුදල මත 24% ක වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 23, 3100, 3179 සහ 3307 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩ්‍රොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බලයලත් මානක එස්. රාජේන්ද්‍ර විසින් 1953 දෙසැම්බර් මස 16 වැනි දින සාදන ලද අංක : 502 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ, බොරැල්ල කොටා පාර ඔස්සේ පිහිටි, කොටා පාරේ, වරිපනම් අංක : 151/4 දරන බෙදා වෙන් කරන ලද ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් : ඊසාන දිගට : ලොට් 1 ද, ගිණිකොන දිගට : ලොට් 12 ද, නිරිත දිගට : ලොට් 3 ද සහ වයඹ දිගට : දැනට කොටා පාරේ වරිපනම් අංක : 141/1, 14/2, සහ 141 ද, යන මායිම් තුළ අංක 502 දරන පිඹුර පරිදි පර්චස් හතයි දශම දෙකයි හයක් (අ. 0, රූ. 0, පර්. 7.26) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ/486/12 යටතේ ලියාපදිංචිව ඇත.

පහත සඳහන් ඉඩම් කොටස් ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

1. බලයලත් මානක එස්. රාජෙන්ද්‍ර විසින් 1953 දෙසැම්බර් මස 16 වැනි දින සාදන ලද අංක 502 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ, බොරැල්ල කොටා පාර ඔස්සේ පිහිටි කොටා පාරේ (කොටසක්) වරිපනම් අංක : ජී 151 දරන බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන ඉඩම් කොටසට මායිම් : ඊසාන දිගට : ලොට් 12 ද, ගිණිකොන දිගට : දැනට වරිපනම් අංක : ජී 151 දරන පරිශ්‍රයේ (කොටසක්) සහ 153 ද, නිරිත දිගට : කොටා පාරද, වයඹ දිගට : ලොට් 10, 6, 5, 4 සහ 3 ද, යන මායිම් තුළ අංක : 502 දරන පිඹුර පරිදි පර්චස් හතයි දශම එකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 7.14) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක : ඒ 879/100 යටතේ ලියාපදිංචිව ඇත.

2. බලයලත් මානක එස්. රාජෙන්ද්‍ර විසින් 1953 දෙසැම්බර් මස 16 වැනි දින සාදන ලද අංක : 502 දරන පිඹුර පරිදි, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ බොරැල්ල කොටා පාර ඔස්සේ පිහිටි කොටා පාරේ (කොටසක්) වරිපනම් අංක : ජී 151 දරන බෙදා වෙන් කරන ලද ලොට් 12 දරන ඉඩම් කොටසට මායිම් : ඊසාන දිගට : ලොට් 1 ද, ගිණිකොනට දිගට : දැනට වරිපනම් අංක : ජී 151 හි (කොටසක්) ද, නිරිත දිගට : (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 11 ද, වයඹ දිගට : ලොට් 2 ද, යන මායිම් තුළ අංක 502 දරන පිඹුර පරිදි පර්චස් එකයි දශම බිංදුවයි තුනක් (අ. 0, රූ. 0, පර්. 1.03) විශාල ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 486/13 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් රෙජිස්ට්‍රාර්.

04-476

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 930 හා 2001 ඔක්තෝබර් 17 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "ප්‍රියංකා මල් ශාලාව" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස අනුරාධපුරයේ ව්‍යාපාරය කරගෙන යන වික්‍රම ආරච්චිගේ ගාමිණී ජයසේකර මහතා විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර්

මස 30 වැනි දිනට ඉහත කී අංක 930 දරන උකස් බැඳුම්කරය මත එකී වික්‍රමආරච්චිගේ ගාමිණී ජයසේකර මහතාගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්ලක්ෂ දහහතර දහස් හාරසීය හැත්තෑ දෙකකුත් ශත දොළහක (රු. 3,14,472.12) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දසලක්ෂ විසිහය දහස් හත්සිය අනූහතරකුත් ශත හැට එකක් (රු. 226,794) වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්ලක්ෂ දහහතර දහස් හාරසීය හැත්තෑ දෙකකුත් ශත දොලහක් (රු. 3,14,472.12) මුදල සහ 2008 දෙසැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ විසිහය දහස් හත්සිය අනූහතරකුත් ශත හැට එකක් රු. 2,26,794.61 සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 930 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 930 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ්ඩියන්කුලම කෝරළේ, අංක 231 කහටගස්දිගිලිය (නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කහටගස්දිගිලිය ග්‍රාමයේ පිහිටි බිම් කට්ටියක් වන උතුරට : මහරූපෆ්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : රජයේ කැලෑව ද, දකුණට : ලයනල් කටුකුරුන්දගේට අයති ඉඩම ද, බස්නාහිරට : කෝන්වැව පාර ද යන මායිම් ඇතුළත රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙයට ඉහත කී පිඹුරේ දැක්වෙන පාරක් සඳහා වෙන් කළ බිම මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

මෙම ඉඩම, බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් නැවත මනින ලදුව එම පිඹුරට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ්ඩියන්කුලම කෝරළේ, අංක 231 කහටගස්දිගිලිය, (නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කහටගස්දිගිලිය ග්‍රාමයේ පිහිටි, "කහටගස්දිගිලිය රජයේ ඉඩම" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් මැන සාදන ලද අංක 3731 හා 2001 ජූලි 4 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ ඉඩමට මායිම්, උතුරු-නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණු-නැගෙනහිරට : ලයනල් කටුකුරුන්දගේ යන අයගේ ඉඩම ද, දකුණු - බස්නාහිරට පාර ද, උතුරු - බස්නාහිරට : මහරූෆ් ගේ ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ සහ ඉහත කී පිඹුරේ දැක්වෙන පාර සඳහා වෙන් කළ බිම ඔස්සේ හා ඒ මතින් මාර්ග අයිතිවාසිකම ද අයත් වේ.

මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

04-355/6

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. බී. සී. ගුණතිලක විසින් ලියා සහතික කරන ලද අංක 1258 හා 2002 අගෝස්තු 29 දින දරන උකස් බැඳුම්කරය මත සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. එස් කන්නන්ගර ලියා සහතික කළ අංක 11 හා 2003 සැප්තැම්බර් 30 දින දරන ද්වීතියික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "නිව් හොරණ බේකරි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස, ව්‍යාපාරය කරගෙන යන හොරණ, නානායක්කාර වන්නි ආරච්චිගේ යෙනිල් කුමාර් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ඔක්තෝබර් 31 වැනි දිනට ඉහත කී අංක 1258 හා අංක 11 දරන උකස් බැඳුම්කර මත එකී නානායක්කාර වන්නි ආරච්චිගේ යෙනිල් කුමාර් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හත්ලක්ෂ විසිනව දහස් හැත්තෑ පහකුත් ශත තිස් අටක (රු. 729,075.38) මුදලක් සහ 2008 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ විසිතුන් දහස් එකසිය පණස් හතකුත් ශත අසූහතරක් (රු.523,157.84) සඳහා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් පොලිය සහ රුපියල් එක්ලක්ෂ හතළිස් නවදහස් නවසිය හතළිහයක් (රු. 149,940) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල වැඩකරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හත්ලක්ෂ විසිනව දහස් හැත්තෑ පහකුත් ශත තිස් අටක (රු. 7,29,075.38) මුදල සහ 2008 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ විසිතුන් දහස් එකසිය පණස් හතකුත් ශත අසූහතරක් (රු. 523,157.84) සඳහා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් පොලිය සහ රුපියල් එක්ලක්ෂ හතළිස් නවදහස් නවසිය හතළිහක් (රු.149,940) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල වැඩකරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපිතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1258 සහ 11 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1258 හා අංක 11 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ කුඹුකේ පත්තුවේ හොරණ නගර සභා සීමාව ඇතුළත, සුදේරිස් සිල්වා මාවතේ පිහිටි, "රාලහාමිල්ලාගේ වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සේනක විතාරණගේ විසින් මැන සාදන ලද අංක 2207 හා 2000 දෙසැම්බර් 16 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් "ඒ" ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අංක 280 දරන පිඹුරේ දැක්වෙන (කලින් අඩි 20 ක් පළල පාරක් වූ දැනට සුදේරිස් සිල්වා මාවත වන) ලොට් අංක එස් 13 ද, නැගෙනහිරට : ඉහත සඳහන් අංක 2207 දරන පිඹුරේ ලොට් බී දරන බිම් කට්ටිය (සුදේරිස් සිල්වා මාවත වරිපනම් අංක 43) ද, දකුණට රාලහාමිල්ලාගේ වත්ත ලොට් ඩී (දැනට අඟුරුවාතොට පාර වරිපනම් අංක 105 ඒ දරන පරිශ්‍රය) ද, බස්නාහිරට : අංක 280 දරන පිඹුරේ ලොට් අංක එස් 7 (දැනට අඟුරුවාතොට පාර වරිපනම් අංක 105 ඒ දරන පරිශ්‍රය) ද යන මායිම් ඇතුළත පර්චස් දොළහකුත් දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.50) (වර්ග මීටර 316.161 ක්) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 43ඒ, 45, 47, 47ඒ සහ 47 බී දරන ගොඩනැගිලි හා එහි පිහිටි සහ ඊට අනුබද්ධ වෙනත් සියලු දේ. මෙය ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙයට දැනට සුදේරිස් සිල්වා මාවත යනුවෙන් හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඩී. ආර්. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 280 හා 1968.01.20 දින දරන පිඹුරේ ලොට් අංක "එස් 13" ලෙස ලකුණු කළ බිම් කට්ටිය තුළින්, මතින් සහ/හෝ ඔස්සේ, උකස්කරුට ද ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහ නිර්මාණ ශිල්පීන්ට. කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසර ලාභීන්ට, සහ ආරාධිතයින්ට මෙයින් මතු සදාකාලයටම, ඔවුන්ගේ අභිමතය හා කැමැත්ත පරිදි කවර වූ හෝ කාර්ය, සඳහා පයින් හෝ අන්‍යාකාරයකින් යාම ඊමට ද අසුන්, ගවයන්, හෝ සතුන් සහිතව හෝ නොමැතිව ද, මෝටර් රථ, ලොරි හෝ වෙනත් ඕනෑම වර්ගයක වාහනයකින්, බර පටවා හෝ නොපටවා, දිවා හෝ රාත්‍රී කාලයේදී ප්‍රවේශ වීමට. පිටවීමට හා ප්‍රත්‍යාගමනයට බාධා විරහිත පූර්ණ අයිතිවාසිකම, නිදහස හා අවසරය ද ඊට අයත් හෝ අනුබද්ධ සහ ඒ හා සමඟම භුක්ති විඳිනු ලබන, දරනු ලබන හා සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලු හා එක් එක් එල ප්‍රයෝජන, අයිතිවාසිකම් හා ලාභ ප්‍රයෝජන ද එහි බිම මතින්, එය තුළින්, ඊට උඩින් එය යටින් සහ/හෝ ඔස්සේ විදුලි රැහැන්, මුදුන් කම්බි, ජලාපවාහන නල, ගෑස් හා ජලනල හා වෙනත් උවාරණ හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවික උපක්‍රම ආදිය යෙදීමට පවත්නා පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම හා නිදහස මීට ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-355/4

---

### ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ්

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුව විසින් 2009 පෙබරවාරි මස 23 වැනි දින පහත දැක්වෙන යෝජනාව විධිමත් ලෙස සම්මත කරන ලදී.

අයකරගැනීමේ නඩුව - ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ, අංක 24 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක්ද පිහිටා තිබෙන ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුව නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. එල්. පෙරේරා විසින් සහතික කරන ලද 2005 ජූනි මස 29 වැනි දින අංක 2219 දරන උකස් බැඳුම්කරය මත ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවට ණය මත අයවිය යුතු, මෙහි මින් මතු සඳහන් කර ඇති මුදල යැවීම ශ්‍රී ලංකාවේ රාජගිරියේ, ලේක් ඩ්‍රයිව්, රෝයල් පාක්, අංක. ඒ 20/06 දරන ස්ථානයේ ඩිල්ෂාන් නේරියස් රොජර් ප්‍රනාන්දු, පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මගින්, ඉහත කී ණය මත අයවිය යුතු මුදල් ගෙවීම සඳහා ඇපයක් ලෙස මෙහි උපලේඛනයේ විස්තර කර තිබෙන දේපළ සහ පරිශ්‍රය ද, ඉහත කී ණය මත අයවිය යුතු මුදල් ගෙවීම සඳහා ඇපයක් ලෙස ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවට උකස් කර ඇති හෙයින්ද,

තවද, 2008 දෙසැම්බර් 14 වැනි දින වන විට, එකී අංක. 2219 දරන උකස් බැඳුම්කරය මත ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවට ඉහත කී ණය මත, ඉහත කී ඩිල්ෂාන් නේරියස් රොජර් ප්‍රනාන්දුගෙන් රුපියල් මිලියන දහයයි අටලක්ෂ දෙසීය පහළොවක් සහ ශත විසි එකක් වූ මුදලක්ද (රු. 10,800,215.21) එකී මිලියන දහයයි අටලක්ෂ දෙසීය පහළොවක් සහ ශත විසි එකක් වූ මුදල (රු. 10,800,215.21) වෙනුවෙන් 2008 දෙසැම්බර් මස 15 වැනි දින සිට වර්ෂයකට සියයට විසිතුනයි දශම හතයි අටක්වූ (23.78%) අනුපාතයක් මත එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තුරු පොලියක් ද අයවිය යුතුව තිබෙන හෙයින් ද,

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුව වෙත, 1990 අංක 04

දරන බැංකු මගින්, ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පවරා ඇති බලතල යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක කමිටුව මෙයින් මෙසේ යෝජනාවක් සම්මත කරයි.

අංක 2219 දරන උකස් බැඳුම්කරය මගින් ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවට උකස් කරන ලද මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කර තිබෙන දේපළ සහ පරිශ්‍රය, රුපියල් මිලියන දහයයි අටලක්ෂ දෙසීය පහළොවක් සහ ශත විසිඑකක් වූ මුදලක් ද (රු 10,800,215.21) එකී රුපියල් මිලියන දහයයි අටලක්ෂ දෙසීය පහළොවක් සහ ශත විසිඑකක් වූ මුදල (රු. 10,800,215.21) මුදල වෙනුවෙන් 2008 දෙසැම්බර් මස 15 වැනි දින සිට සියයට විසිතුනයි දශම හතයි අටක්වූ (23.78%) අනුපාතයක් මත, එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තුරු පොලියක්ද, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ප්‍රචාරක ගාස්තුද, විකිණීම පිළිබඳ ගාස්තුද, සහ වෙනත් ගාස්තු ද, 2008 දෙසැම්බර් මස 15 වැනි දිනට පසු ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් ලිමිටඩ් නම් බැංකුවට යම් මුදලක් ගෙවා තිබේ නම්, එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස ශ්‍රී ලංකාවේ කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 දරන ස්ථානයේ බලපත්‍රලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය.

### උපලේඛනය

(බලයලත් මිනුම්දෝරු ඩී. ඩබ්. ගුණරත්න විසින් සාදන ලද 2235 දරන පිඹුරේ ඒ, බී. සහ සී දරන බිම් කට්ටි ලෙස දක්වා ඇති ඉඩම් කොටස් සහ බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. ගුණරත්න විසින් සාදන ලද අංක. 2235/1ඒ සහ 1 බී දරන පිඹුරේ 1 සී දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති ඉඩම් කොටස නැවත මැන ඒකාබද්ධ කර ඇති) කැටකැලගහවත්ත කැටකැලගහඕවිට සහ ඇස්වැද්දුමඕවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමන් බලයලත් මිනුම්දෝරු එල්. පී. ඒ. ශාන්ත ප්‍රියා පෙරේරා විසින් සාදන ලද 2003 ජූලි මස 3 වැනි දින අංක 1613 දරන පිඹුරේ බිම් කට්ටි අංක 1 ලෙස දක්වා ඇත්තාවූද, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ අධිකාරි පත්තුවේ මුල්ලේරියාව, කොටිකාවත්ත ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත හිඹුටාන ගමේ මුල්ලේරියාව පිහිටි එකී වරිපනම් අංක. 46/1 දරන්නාවූද, එකී අංක 1613 දරන පිඹුර ප්‍රකාර, උතුරින් : බාරොන් තිලකානන්ද මාවතේ අයි. ඒ. ඩී. එස්. එස්. විජේරත්න විසින් හිමිකම් පාන ඉඩමෙන් සහ ගුණසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ නැගෙනහිරින්, පාරෙන්, උඩුමුල්ල පාරෙන් සහ ජේ. සී. අබේවර්ධන, ඒ. රත්නායක සහ කේ. කේ. සංජීව යන අය විසින් හිමිකම් කියන ඉඩම්වලින් සහ ඉහතකී අංක. 2235/1ඒ, සහ 1 බී දරන පිඹුරේ 1 ඒ දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති ඉඩමෙන් සහ දකුණින් : පාරෙන්, ගුණසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ එච්. එම්. කරුණාරත්න සහ බී. ඩබ්. පෙරේරා විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ ඉහත කී අංක 2235/1ඒ සහ 1බී දරන පිඹුරේ 1ඒ දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති ඉඩමෙන් සහ බස්නාහිරෙන් : පාරෙන් හා ගුණසේකර හා තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් හා ඒ. රත්නායක විසින් හිමිකම් කියන ඉඩමෙන් මායිම්වූද, විශාලත්වයෙන් අක්කර හතරයි රූඩ් තුනක් (අ. 4, රූ. 3, පර්. 0) (හෙක්ටයාර් 1.9223) ලෙස බෙදා වෙන් කළ ඉඩම් කොටස, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. 100/17 ලියාපදිංචි කර ඇත.

එකී අංක 1613 දරන පිඹුරේ බිම් කට්ටි අංක 1 ලෙස දක්වා ඇති ඉහත විස්තර කර ඇති ඉඩම් කොටස මෙසේද විස්තර කර ඇත.

(බලයලත් මිනුම්දෝරු ඩී. ඩබ්ලිව්. ගුණරත්න විසින් සාදන ලද අංක 2235 දරන පිඹුරේ ඒ, බී සහ සී දරන බිම් කට්ටි ලෙස දක්වා ඇති ඉඩම් කොටස සහ බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. ගුණරත්න විසින් සාදන ලද අංක 2235/1 ඒ සහ 1බී දරන පිඹුරේ 1 සී දරන බිම් කට්ටි ලෙස දක්වා ඇති ඉඩම් කොටස නැවත මැන, ඒකාබද්ධ කර ඇති) කැටකැලගහවත්ත කැටකැලගහඕවිට සහ ඇස්වැද්දුමඕවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. එස්. පෙරේරා විසින් සාදන ලද 2003 අගෝස්තු මස 4 වැනි දින අංක 1628 දරන පිඹුරේ බිම් කට්ටි අංක 1 ලෙස දක්වා ඇත්තාවූද, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ අධිකාරි පත්තුවේ මුල්ලේරියාව, කොටිකාවත්ත ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත හිඹුටාන ගමේ මුල්ලේරියාවේ පිහිටි එකී වරිපනම් අංක 46/1 දරන්නාවූද, එකී අංක. 1628 දරන පිඹුර ප්‍රකාර, උතුරින් : බාරොන් තිලකානන්ද මාවතේ අයි. ඒ. ඩී. එස්. එස්. විජේරත්න විසින් හිමිකම් පාන ඉඩමෙන් සහ ගුණසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ නැගෙනහිරින් : පාරෙන්, උඩුමුල්ල පාරෙන් සහ ජේ. සී. අබේවර්ධන, ඒ. රත්නායක සහ කේ. කේ. සංජීව යන අය විසින් හිමිකම් කියන ඉඩම්වලින් සහ ඉහත කී අංක. 2235/1ඒ, සහ 1බී දරන පිඹුරේ 1ඒ දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති ඉඩමෙන් සහ දකුණින් : පාරෙන්, ගුණසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ එච්. එම්. කරුණාරත්න සහ බී. ඩබ්. පෙරේරා විසින් හිමිකම් කියන ඉඩමෙන් සහ ඉහත කී අංක 2235/1ඒ සහ 1බී දරන පිඹුරේ 1 ඒ දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති ඉඩමෙන් සහ බස්නාහිරින් : පාරෙන් සහ ගුණසේකර සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩමෙන් මායිම්වූද, විශාලත්වයෙන් අක්කර හතරයි රූඩ් තුනක් (අ. 4, රූ. 3, පර්. 0) (හෙක්ටයාර් 1.9223) වූද බෙදා වෙන් කළ ඉඩම් කොටස.

පහත දැක්වෙන මාර්ග අයිතිය ද ඇතිව :

01. ඉහතකී හිඹුටාන ගමේ මුල්ලේරියාව පිහිටි කැටකැලගහවත්ත කැටකැලගහඕවිට සහ ඇස්වැද්දුමඕවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ එකී අංක 2235 දරන පිඹුරේ ඩී දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති (අඩි 15 ක් පළල පාරක් සඳහා සංචිතය සහ එකී අංක. 2235 දරන පිඹුර ප්‍රකාර උතුරින් : පොල්වත්තගේ ජුවානිස් පෙරේරාගේ ඉඩමෙන් සහ නැගෙනහිරින් : ගල්වාන හන්දියේ සිට තලංගම දක්වා වැටී ඇති මුල්ලේරියාව රෝහල් පාරෙන් සහ දකුණින් : එකී අංක. 2235 දරන පිඹුරේ බී. සී සහ 1 දරන බිම්කට්ටිවලින් සහ බස්නාහිරින් : ඊ දරන බිම් කට්ටියෙන් (අඩි 12 ක් පළල පාරක් සඳහා සංචිතය මායිම්වූද, ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම පහයි බිංදුවකින් (අ. 0, රූ. 0, පර්. 18.50) යුක්තවූද බෙදා වෙන් කළ ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. 81/159 හි ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී හිඹුටාන ගමේ මුල්ලේරියාවේ පිහිටි කැටකැලගහවත්ත කැටකැලගහඕවිට සහ ඇස්වැද්දුමඕවිට යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ එකී අංක. 2235 දරන පිඹුරේ ඊ දරන බිම් කට්ටිය ලෙස දක්වා ඇති (අඩි 12 ක් පළල පාරක් සඳහා සංචිතය සහ එකී අංක. 2235 දරන පිඹුර ප්‍රකාර උතුරින් : ඩී දරන බිම් කට්ටියෙන්, (අඩි 15 ක් පළල පාරක් සඳහා සංචිතය) සහ නැගෙනහිරින් : එම ඉඩමේම ඒ දරන බිම් කට්ටියෙන් සහ දකුණින් : ඉඩමේ සිට ගෙවල්වලට වැටී ඇති පාරෙන් සහ බස්නාහිරින් : එම ඉඩමේම ඒ දරන බිම් කට්ටියෙන් මායිම්වූද ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම එකයි බිංදුවකින් (අ. 0, රූ. 0, පර්. 16.10) යුක්තවූද බෙදා වෙන් කළ ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. 81/160 හි ලියාපදිංචි කර ඇත.

විලියම් එස්. එම් ටැම්,
ද හොංකොං ඇන්ඩ් ෂැංහයි,
බැංකින් කෝපරේෂන් ලිමිටඩ්,
නම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ
විධායක කමිටුවේ නියෝජ්‍ය ලේකම්.

04-356

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බණ්ඩාරවෙල
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.02.26 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2005.11.21 දින සහ අංක 229 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැරකුම්බරාගේ හෙවත් පැරකුම්රාජගේ විජේන්ද්‍රපාල ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස්හත්දහස් එකසිය අනූනවයයි ශත හැටහය (රු.2,47,199.66) ක මුදලක් 2008.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,47,199.66 ක මුදලට 2008.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 229 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභාව තුළ සියඹලාපේ ගමේ පිහිටි "ඇටඹගහකනත්ත", නමැති ඉඩමට බලයලත් මානක අයි. කොටඹගේ විසින් මැන සාදන ලද අංක 128/2005 සහ 2005 ජනවාරි මස 24 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් ඒ 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරු නැගෙනහිරට : වෙන් කරන ලද පාරකින් ද (අඩි 10 ක් පළලැති), දකුණු නැගෙනහිරට : පිඹුරු අංක 242/98 ට අයත් ලොට් ඒ හි ඉතිරි කොටසින් ද, දකුණු බස්නාහිරට : පිඹුරු අංක 242/98 ට අයත් ලොට් ඒ හි ඉතිරි කොටසින් ද, උතුරු බස්නාහිරට : ඇලෙන් ද මායිම් වූ එකී අංක 128/2005 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතර (අ. 0, රූ. 0, පර්. 14) ක් විශාල ඉඩමට අයත් අනෙකුත් සියළුම දේත් සමග. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 568/254 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක පී. එම්. ලීලාරත්න විසින් මැන සාදන ලද අංක 212 හා 2000.09.14 වන දිනැති පිඹුරෙහි දැක්වෙන පරිදි අඩි 12 ක් පළල පාර සඳහා වෙන් කරන ලද කොටස මතින් යාමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-473/4

A2 - B 80005

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ(397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.01.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එස්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද 2002.11.14 දිනැති අංක 25360 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.10.28 දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිහතර ලක්ෂ හැත්තෑදහස් හත්සිය අසූහයයි ශත හැත්තෑනවයක (රු. 24,70,786.79) මුදලක් සමග රුපියල් දහතුන් ලක්ෂ තුන්දහස් පන්සිය තිස් පහයි ශත හතරක (රු. 13,03,535.04) මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොළියක් ද, 2008.10.29 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කඩවත, ගෝනහේන පාර, 509/2සී හි පදිංචි වැලිවිට විදානලාගේ සැම්සන් කල්යාන පෙරේරා වීරවර්ධන වැලිවිට මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 25360 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිහතර ලක්ෂ හැත්තෑ දහස් හත්සිය අසූ හයයි ශත හැත්තෑනවයක (රු. 24,70,786.79) මුදල සමග 2008.10.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, බකමූණ ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, නාරංවල උපකාර්යාලයේ මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ රන්මුතුගල ග්‍රාමයේ අඹගහවත්ත, මිල්ලගහවත්ත සහ කජු ගහදෙනිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2002 ජනවාරි 02 දිනැති අංක 2735 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස සටහන් කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අංක 117/2000 දරන පිඹුරෙහි ලොට් CIG සහ CIF ද, නැගෙනහිරට: ලොට් 2 ද, දකුණට : ජී. එම්. සෙනෙවිරත්නගේ ඉඩම ද, බස්නාහිරට: රන්මුතුගල පාර ද, මායිම්ව එකී අංක 2735 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිපහක (අ. 0, රූ. 0, පර්. 25) වපසරියකින් යුක්ත වන අතර, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී604/21 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ (අංක 02, නාරංවල, උපකාර්යාලය) රන්මුතුගල ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත, මිල්ලගහවත්ත සහ කජුගහදෙණිය නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2002 ජනවාරි 02 දිනැති අංක 2735 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 3 උතුරට : අංක 117/2000 දරන පිඹුරෙහි අඩි 20 පළල පාරේ ලොට් CID ද, නැගෙනහිරට : අංක 117/2000 දරන පිඹුරෙහි ලොට් CID සහ අංක 24/2001 දරන පිඹුරෙහි ලොට් CIAY ද, දකුණට : ජී. එම්. සෙනෙවිරත්නගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 2ද මායිම් ව එකී අංක

2735 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස්පහක (අ. 0, රූ. 0, පර්. 35) වපසරියකින් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 604/20 හි ලියාපදිංචි කර ඇති අතර, මෙයට මහජන නොතාරිස් එම්. එන්. පෙරේරා විසින් සහතික කරන ලද 2002 පෙබරවාරි 01 දිනැති අංක 3501 දරන නිදහස් කිරීම් ඔප්පුව සහ මහජන නොතාරිස් ඩබ්. පී. එම්. ලක්ෂ්මන් විසින් සහතික කරන ලද 2002 ජනවාරි 09 දිනැති අංක 842 දරන ඔප්පුව ප්‍රකාර හිමිව පවතින, එකී අංක 2735 දරන පිඹුරෙහි අඩි 20 පළල පාරට වෙන් කළ කොටස මත සහ එය දිගේ පාරේ අයිතිය ද හිමිය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ඩී. එම්. ඩී. ආර්. එස්. එස්. ජයවර්ධන,
කළමනාකරු.

ලංකා බැංකුව,
බකමූණ ශාඛාව.

04-418

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ(397 අධිකාරිය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.02.06 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඒ. සී. එස්. හමීඩ් විසින් සහතික කරන ලද 2001.08.11 දිනැති අංක 1007 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.02.02 දින තෙක් පොළිය වශයෙන් රුපියල් තුන් ලක්ෂ තුන් දහස් තුන්සිය හැටහතරයි ශත අසූඅටක (රු. 3,03,364.88) මුදලක් සමග රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදලක් මත වසරකට සියයට විසිපහයි දශම පහ (25.5%) බැගින් පොළියක් ද, 2009.02.03 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් උපුල්දෙණිය, කනදර රත්මලේ හි පදිංචි හේරත් මුදියන්සේලාගේ පියදාස මහතා සහ හේරත් මුදියන්සේලාගේ සුනන්ද ධර්මසිරි මහතා යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී අංක 1007 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තුන් ලක්ෂ තුන් දහස් තුන්සිය හැටහතරයි ශත අසූඅටක (ර. 3,03,364.88) මුදල සමග 2009.02.03 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්සල පාර හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියුස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, කහටගස්දිගිලිය ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ , කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨසයේ, කනදර කෝරළේ, රත්මලේ අංක1 99 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ රත්මලේ ග්‍රාමයේ පිහිටි “ස්ටේට්ලෑන්ඩ්” නමැති ඉඩම් කැබැල්ල, උතුරට : පී. ඩී. විජේරත්නගේ ඉඩම ද, නැගෙනහිරටඃ මැස්සගහපු වැව වැවට වෙන්කළ කොටස ද, දකුණට : පී. බී. සුනිල් සෙනෙවිරත්නගේ ඉඩම ද, බස්නාහිරට : ගලෙන්බිඳුනුවැව දක්වා වූ ප්‍රධාන පාර ද, මායිම් ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති ගහකොළ වැවිලි, සහ ගොඩනැගිලි ආදී සියළු දේද වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 248/202 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම අංක 3422 දරන මැතක දී සාදන ලද මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත :

ඉහත කී රත්මලේ ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 1999.10.22 දිනැති අංක 3422 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපනය කර ඇති “ස්ටේට් ලෑන්ඩ් නොහොත් ඉඩම” එනම් එකී ලොට් 1 උතුරට : පී. බී. විජේරත්නගේ ඉඩම ද, නැගෙනහිරට : මැස්සගහපුවැව වැවට වෙන් කළ කොටස ද, දකුණට : පී. බී. සුනිල් සෙනෙවිරත්නගේ ඉඩම ද, බස්නාහිරට : පාර ද, මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති ගහකොළ වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියළු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

කේ. අප්පුහාමි මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
කහටගස්දිගිලිය.

04-419

---

## රුහුණ සංවර්ධන බැංකුව - මාතර නගර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2008.11.18 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් හතරසිංහ ආරච්චිගේ ධර්මදාස මහතා විසින් සහතික කරන ලද 2007.04.19 දිනැති අංක 2153 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාතර, වල්ගම, ගාලු පාරේ 102/10 ලිපිනයේ පදිංචි බෝධිමානගේ මංජුල ප්‍රියවන්ද සහ බෝධිමානගේ සරණපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අටලක්ෂ හැටතුන්දහස් හාරසිය අසූනමයයි ශත තිස්පහක (රු. 8,63,489.35) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2007.05.30 දින සිට වර්ෂයකට 25.5% බැගින් රුපියල්

අටලක්ෂ හැටතුන්දහස් හාරසිය අසූනමයයි ශත තිස්පහක (රු. 8,63,489.35) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද, සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2153 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ වල්ගම පිහිටි මහගෙ ගෙවත්ත හෙවත් මහබඩවත්ත ඉඩමේ බෙදා වෙන් කළ "ජී" අක්ෂරය දරන කැබැල්ලට මායිම් උතුරට : මෙම ඉඩමේ බී. සී. ඩී. ඊ. එෆ්. දරන කැබැලි ද, නැගෙනහිරට : පොලයවත්ත හෙවත් බඩල්වත්ත ද, දකුණට: මෙම ඉඩමේ "එච්" අක්ෂරය දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ "ඒ" අක්ෂරය දරන කැබැල්ල ද, මායිම් වන පර්චස් විසි එකයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 21.8) විශාල ඉඩම් කැබැල්ලේ සියළු ගහකොළ පලතුරු සමග ඉඩම වේ.

එකී ඉඩම මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 416/242 හි ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී ඉඩම මෑතකදී මැන සකස් කළ බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතාගේ අංක 5185 සහ 1995.10.14 සහ 2002.01.30 දින දරන සැලැස්මේ මැනවින් නිරූපණය වන අතර, ඉහත සැලැස්ම ප්‍රකාර ඉහත සැලැස්මේ අංක 01 ලෙස ලකුණු කර ඇති කැබැල්ලට එනම්, මහගෙවත්ත හෙවත් මහබඩවත්ත නමැති ඉඩමේ "ජී" අක්ෂර දරන කැබැල්ලට මායිම් උතුරට : මෙම ඉඩමේ බී. සී. ඩී. ඊ. සහ එෆ්. දරණ කැබැලි ද, නැගෙනහිරට : නිවාසවල සිට ගාලු මාතර ප්‍රධාන පාරට වැටෙන පාර ද, දකුණට : මෙම ඉඩමේ "එච්" අක්ෂරය දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ "ඒ" අක්ෂරය දරන කැබැල්ලද යන මෙකී මායිම් තුළ පර්චස් විසි එකයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 21.8) විශාල ඉඩම තුළ සියළු ගහකොළ, පලතුරු සමග සම්පූර්ණ ඉඩම වේ. මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 509/1 වං 39/201 යටතේ 2007.04.24 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ.
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක,

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

04-403

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008 නොවැම්බර් 04 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2007.05.17 දිනැති අංක 559 දරන උකස් බැඳුම්කරය සහ මහජන නොතාරිස් ගයාද අල්විස් විසින් සහතික කරන ලද 2002.11.22 දිනැති අංක 1539 දරන උකස් බැඳුම්කරය මගින් සුරැකුම් කරනු ලැබ පිළියන්දල, සිද්ධමුල්ල, සමන් මාවත, අංක 1 හි, නැලිගමගේ සරත් ධම්මික පෙරේරා සහ නැලිගමගේ දයාසිරි බන්දු පෙරේරා (සුපර්කොම් කොම්පියුටර් සිස්ටම්ස් හි හවුල්කරුවෝ) යන අයට බැංකුව විසින් ප්‍රදානය කරන ලද රුපියල් ලක්ෂ පනහක (රු. 50,00,000) මුදලක් ඔවුන් විසින් ගෙවීම පැහැරහැර ඇත. 2008.08.25 දිනට අයිරාව මත හිඟහිටි ශේෂය සහ පොලිය රුපියල් හැටඑක්ලක්ෂ හැටහතර දහස් හැටනවයයි ශත පහළොවක (රු. 61,64,069.15) මුදලක් සමග රුපියල් හතලිස් නව ලක්ෂ අනූපන් දහස් පන්සිය විසිඅටයි ශත දහනවයක (රු. 49,95,528.19) මුදලක් මත වසරකට සියයට විසිහය (26%) බැගින් පොළියක් ද, 2008.08.26 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් නැලිගමගේ සරත් ධම්මික පෙරේරා මහතා සහ නැලිගමගේ දයාසිරි බන්දු පෙරේරා යන අයට බැංකුව ලබා දුන් ඉහත අයිරාව ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇත.

2. එකී අංක 1539 සහ 559 දරන බැඳුම්කර මත 2008.08.25 දිනට අයිරාව මත අයවියයුතු එකී රුපියල් හැටඑක්ලක්ෂ හැටහතර දහස් හැටනවයයි ශත පහළොවක (රු. 61,64,069.15) මුදල සමග රුපියල් හතලිස් නව ලක්ෂ අනූපන් දහස් පන්සිය විසිඅටයි ශත දහනවයක (රු. 49,95,528.19) මුදලක් මත 2008.08.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවියයුතු සියයට විසිහය (26%) බැගින් වූ වැඩිපුර පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, මහරගම අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (වැතර උප කාර්යාලය) සිද්ධමුල්ල ග්‍රාමයෙහි පිහිටි තානායම්ගොඩැල්ල නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. සිරිසේන විසින් සාදනලද 1999 මාර්තු 20 දිනැති අංක 337 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපනය කර විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1 උතුරට: අංක 335 දරන පිඹුරෙහි ලොට් 19 පාර ද, (ඔප්පුවට අනුව අංක 335 දරන පිඹුරෙහි ලොට් 20), නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : එස්. ධර්මශ්‍රී තේවාහෙට්ටිගේ ඉඩම ද (ඔප්පුවට අනුව ධර්මශ්‍රී දේවහෙට්ටිගේ ඉඩම) බස්නාහිරට : ප්‍රධාන පාර ද, මායිම්ව එකී අංක 337 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි එකක (අ. 0, රූ. 0, පර්. 21) වපසරියකින් යුක්ත වූ බිම් ප්‍රමාණය සමග එහි ඇති ගහකොළ හා වෙනත් සියළු දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 307/173 හි ලියාපදිංචි කොට ඇත.

සී. ජී. ප්‍රේමතිලක,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහරගම.

04-415

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.01.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඒ. එම්. තිරුවාදවුරන් මහතා විසින් සහතික කරන ලද 2007.08.23 දිනැති අංක 1602 දරන අතිරේක උකස් බැඳුම්කරය සහ 2005.10.27 දිනැති අංක 1140 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2008.11.27 දින තෙක් පොළිය වශයෙන් රුපියල් දහතුන් ලක්ෂ පනස් දෙදහස් පන්සිය පනස් නවයයි ශත තිස්තුනක් (රු. 13,52,559.33) සහ රුපියල් දාහත් ලක්ෂ දහතුන් දහස් හයසිය හැත්තෑවයි ශත අසූපහක (රු.17,13,670.85) මුදලක් සමග රුපියල් එකොලොස් ලක්ෂයයි නවයක(රු. 11,00,009) සහ රුපියල් දහතුන් ලක්ෂ පනස් නව දහස් දෙසීයක (රු. 13,59,200) මුදලක් මත පිළිවෙලින් වසරකට සියයට විසිනවය (29%) බැගින් පොළියක් ද 2008.11.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් යාපනය, තිරුනෙල්වේලි, අඩියාපදම් පාර, අංක 116/2 හි පදිංචි නල්ලතම්බි මහාලිංගම් මහතා සහ බාමිනි මහාලිංගම් මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී අංක 1602 හා 1140 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දහතුන්ලක්ෂ පනස් දෙදහස් පන්සිය පනස් නවයයි ශත තිස්තුනක (රු. 13,52,559.33) සහ රුපියල් දාහත් ලක්ෂ දහතුන්දහස් හයසිය හැත්තෑවයි ශත අසූපහක (රු.17,13,670.85) මුදල සමග 2008.11.28 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යාපනය, කේ. කේ. එස්. පාර, අංක 692 හි පදිංචි වෙන්දේසිකාර කේ. පී. බාලක්‍රිෂ්ණන් මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**නිශ්චල දේපළ පිළිබඳ විස්තරය**

උතුරු පළාතේ, යාපනේ කොට්ඨාසයේ සහ දිස්ත්‍රික්කයේ, නල්ලූර් පත්තුවේ, තිරුනෙල්වේලි ආදායම් කොට්ඨාසයේ පිහිටි ලාස් හයහමාරක (ලා. 06 1/2 V. C.) වපසරියකින් යුත් “අරුකලඩ්ඩි” යැයි කියන සහ එනමැති ඉඩමෙන් එම V. C. ලාස් හය හමාරෙන් උතුරු පැත්තෙන් වූ V. C. ලාස් තුනහමාරක (ලා 3 1/2 V. C.) බෙදන ලද කොටස දැනටමත් දායාද වශයෙන් දෙන ලදුව, ඉතිරිව ඇති ඉඩම් කොටස V. C. ලාස් තුනක (ලා 3 V. C) වපසරියකින් යුතුව දකුණු පසින් ඇත. මෙම V. C. ලාස් තුනේ (ලා 3 V. C.) ඉඩම, නිවස, වගාකරන ලද සහ ඉබේ වැවෙන වගාවන් ද, උතුරු දෙසින් වූ මායිම් ඉඩමේ පිහිටි ළිඳේ කොටස ද පාරේ අයිතිය ද දිය පාරකින්ද සමන්විතය. එය යාපනේ මහජන නොතාරිස් ආර්. රත්නරාජා විසින් මැනක දී අඳින ලද 2005.06.20 දිනැති අංක 1064 දරන පිඹුර යටතේ ලොට් 01 ලෙස දක්වා ඇති V. C. ලාස් තුනක සහ කුලී දහසයයි දශම අටයි එකක (ලා. 03 V. C. කුලී 16.81) වපසරියකින් යුක්තව නල්ලූර් ප්‍රදේශීය සභා සීමා තුළ අංක 9 කොටසෙහි යාපනේ අඩියපාදම් පාරේ, වරිපනම් අංක 116/2, දරන අතර, එය පහත ආකාරයට මායිම් වී ඇත. නැගෙනහිරට : පී. සේනාධිරාජාට අයිති දේපළ ද, උතුරට : ගනේෂන්ගේ බිරිඳ කුමුදිනීගේ දේපළ ද, බටහිරට : පටු මග ද, දකුණට : පී. සේනාධීරාජාට අයිති දේපළ ද වශයෙන් සියල්ල මේ සීමා තුළය. මෙය යාපනේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 356 වෙළුමෙහි 150 වැනි පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ්. ප්‍රේමරාජන්,
කළමනාකරු.

ලංකා බැංකුව,
තිරුනෙල්වේලි.

04-421

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුනු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. එස්. කන්නන්ගර විසින් ලියා සහතික කරන ලද අංක 167 හා 2004 සැප්තැම්බර් 09 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම (මෙහි මින් මතු “ණය ගැණුම්කරු” යනුවෙන් සඳහන් කරනු ලබන), ඉංගිරියේ, මහමේස්ත්‍රිගේ මෙල්වින් සරාජ් ශ්‍රී ශාන්තිරත්න සිල්වා නොහොත් මහමේස්ත්‍රිගේ මෙල්වින් සරත් ශාන්ත ටිරාජ් සිල්වා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ඔක්තෝබර් 31 වැනි දිනට ඉහත කී අංක 167 දරන උකස් බැඳුම්කරය මත එකී මහමේස්ත්‍රිගේ මෙල්වින් සරාජ් ශ්‍රී ශාන්තිරත්න සිල්වා නොහොත් මහමේස්ත්‍රිගේ මෙල්වින් සරත් ශාන්ත ටිරාජ් සිල්වා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දස ලක්ෂ තිස් අට දහස් අටසිය විසි අටකුත් ශත දහහතක (රු. 10,38,828.17) මුදලක් සහ 2008 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හය ලක්ෂ තිස්නව දහස් නවසිය අනූ දෙකක (රු. 6,39,992) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකය (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5 ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දස ලක්ෂ තිස්අට දහස් අටසිය විසි අටකුත් ශත දහහතක (රු.10,38,828.17) මුදලක් සහ 2008 නොවැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය

දක්වා එයින් රුපියල් හය ලක්ෂ තිස්නව දහස් නවසිය අනූ දෙකක (රු. 6,39,992) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජුලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5 ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 167 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 167 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, නම්බපාන පිහිටි, මීගහවත්ත නිරිතදිග මායිමේ "බිම් කට්ටිය" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගාමිණී විජේසිංහ විසින් මැන සාදන ලද අංක 2416 හා 2004.03.21 දින දරන පිඹුරේ ලොට් අංක 15සී ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : පණුගල් ගොඩැල්ලවත්ත, ජී. රනේපුර සහ තවත් අය හිමිකම් කියන පණුගල් ගොඩැල්ලවත්ත ද, නැගෙනහිරට : අංක 4646 දරන පිඹුරේ ලොට් අංක 14 ලකුණු කළ පාර ද, දකුණට : අංක 4646 දරන පිඹුරේ ලොට් අංක 13 ද, බස්නාහිරට : ගම්සභා පාර ද, යන මායිම් ඇතුළත රූඩ් එකකුත්, පර්චස් තිස්පහයි දශම අටයි දෙකක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 35.81) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගහකොළ සහ වෙනත් සහ වෙනත් සියලු දේ.

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, නම්බපාන පිහිටි, මීගහවත්ත නිරිතදිග මායිමේ "බිම් කට්ටිය" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. සිරිල් වික්‍රමගේ විසින් මැන සාදන ලද අංක 4646 හා 2000.10.13 දින දරන පිඹුරේ ලොට් අංක 15 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම වන උතුරට : කේ. ජේ. ජයසිංහ හිමිකම් කියන පණුගල් ගොඩැල්ල වත්තේ ලොට් අංක 17 ද, නැගෙනහිරට: ලොට් අංක 14 සහ ලොට් අංක 13 ද, දකුණට : ලොට් අංක 14 සහ ලොට් අංක 13 ද, බස්නාහිරට : ගම්සභා පාර සහ ලොට් අංක 17 සහ 16 ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත්, පර්චස් පහයි දශම හතරයි හතරක් (අ. 0, රූ. 02, පර්. 54.44) බිම් ප්‍රමාණයෙන් නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි එකයි හයයි එකක් (හෙ.0.2161) යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැවිලි, ගසකොළ සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-355/5

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0233300229.
ණයකරුගේ සම්පූර්ණ නම : ඇන්සලිම් පෝල් හරින්ද්‍ර කුමාර් ද සිල්වා.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. රුහුණුහේවා විසින් ලියා සහතික කරන ලද අංක 1508 හා 1997.01.17 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින්, එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑපන්දහස් එකසිය අනූහතරයි ශත අනූතුනක (රු. 1,75,194.93) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑනව දහස් තුන්සිය පනස් එකයි ශත අසූතුනක (රු. 79,351.83) මුදල ද, වර්ෂ 2007.04.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් අනූපන්දහස් අටසිය හතළිස්තුනයි ශත දහයක් (රු.95,843.10) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑපන්දහස් එකසිය අනූහතරයි ශත අනූතුනක් (රු. 1,75,194.93) ද,

(2) එකී රුපියල් හැත්තෑනමදහස් තුන්සිය පනස්එකයි ශත අසූතුනක (රු.79,351.83) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක්වූ මැයි මස 30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, තලාහේන උපකාර්යාලයේ වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ, දූන්ගාල්පිටිය ග්‍රාමයෙහි පිහිටි බටහිර පමුණුගම වරිපනම් අංක 991/72 හි පිහිටි වැරැල්ලගහවත්ත නමැති ඉඩමට 1995.07.05 දින ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 2859 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, ඊසානට:

ප්‍රාදේශීය සභා පාර ද, ගිණිකොණට : ජෝන්ස් කිරිහෙට්ටි යන අයට අයත් ඉඩම ද, නිරිතට : සේපාලිකා කිරිහෙට්ටි යන අයට අයත් ඉඩම ද, වයඹට : ප්‍රාදේශීය සභා පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම දෙකයි පහක (අක්. 0, රූ. 0, පර්. 7.25) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද, සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C792/75 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-444

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.09.29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් සරත් ජී. මානවඩු මහතා විසින් සහතික කරන ලද 2006.12.21 වැනි දිනැති අංක 2425 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.08.07 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ පනස් දහස් අටසිය අසූඑකයි ශත දෙකක (රු. 6,50,881.02) මුදලක් සමග රුපියල් පන්ලක්ෂ අනූහතර දහස් පනස් නවයයි ශත විසිඅටක (රු. 5,94,059.28) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොළියක් ද, 2008.08.08 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් දෙවිනුවර, පට්ටිහේන, අංක 51හි පදිංචි පටබැඳි මද්දුමගේ විමලසේන මහතාගෙන් සහ පටබැඳි මද්දුමගේ නිරංග රුවන් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2425 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හයලක්ෂ පනස් දහස් අටසිය අසූඑකයි ශත දෙකක (රු. 6,50,881.02) මුදල සමග 2008.08.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 89හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පත්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට දෙවිනුවර ලංකා බැංකු ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැල්ලබොඩ පත්තුවේ, දෙවිනුවර උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පට්ටියහේන ග්‍රාමයේ පිහිටි පට්ටියහේන නමැති ඉඩමේ සර්වෙයර් ජනරාල් විසින් සහතික කරන ලද අංක මාර/4/(මාර 245) දරන පිඹුරෙහි ලොට් අංක 95 ලෙස සටහන් කර දක්වා ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 95, උතුරට : අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් 83 ද, නැගෙනහිරට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 96 සහ 97 ද, දකුණට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 84 (පාර) ද, බස්නාහිරට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 84 (පාර) ද මායිම්ව පර්චස් විසිඑකයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 21.5) වපසරියකින් යුක්ත වන අතර මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි L. D. O. B9/175 හි ලියාපදිංචි කර ඇත.

මෙකී ලොට් අංක 95 බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් විසින් මැතකදී සාදන ලද 2005 නොවැම්බර් මස 08 වැනි දින අංක 1122 දරන පිඹුරට අනුව පහත සඳහන් ආකාරයට විස්තර කොට ඇත.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, දෙවිනුවර උතුර පිහිටි පට්ටියහේන නමැති ඉඩමෙහි අංක 1122 දරන පිඹුරෙහි ලොට් අංක 95 ලෙස සටහන් කොට විස්තර කොට ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 95, උතුරට : අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් 83 ද, නැගෙනහිරට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 96 සහ 97 ද, දකුණට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 80 (පොදු පාර) ද, බස්නාහිරට : එකී අංක මාර/245 දරන පිඹුරෙහි ලොට් අංක 84 (පාර) ද මායිම්ව එකී අංක 1122 දරන පිඹුරට අනුව පර්චස් විසිඑකයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 21.5) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගස්, වැවිලි සහ සියළු දේද වේ.

එම්. එම්. චන්ද්‍රපාල,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
දෙවිනුවර.

04-417

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් ලියා සහතික කරන ලද අංක 2316 හා 2005 නොවැම්බර් මස 02 දින දරන අංක 2449 හා 2006 මාර්තු 27 වැනි දින

දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, "තත්සරණි එන්ටප්‍රයිසස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන පොතුපිටියගේ දොන් ඉන්දික අරුණ කුමාර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 සැප්තැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 2316 හා 2449 දරන උකස් බැඳුම්කර මත එකී පොතුපිටියගේ දොන් ඉන්දික අරුණ කුමාර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් අටලක්ෂ අසූනව දහස් හාරසිය පණස් අටකුත් ශත විසි අටක (රු. 889,458.28) මුදලක් සහ 2008 ඔක්තෝබර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ දෙදහස් එකසිය පහළොහකුත් ශත අනූපහක් (රු. 602,115.95) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවලදී ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ අසූනව දහස් හාරසිය පණස් අටකුත් ශත විසිඅටක (රු. 8,89,458.28) මුදල සහ 2008 ඔක්තෝබර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ දෙදහස් එකසිය පහළොහකුත් ශත අනූපහක් (රු. 6,02,115.95) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවලදී ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත සඳහන් උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2316 හා 2449 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනදරා කෝරළේ, අංක 246 ග්‍රාම නිලධාරි වසමේ වන්නියන් කුලම ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් මැන සාදන ලදුව, ඔහු භාරයේ තිබෙන, අංක 21 දරන ක්ෂේත්‍ර පත්‍රයේ, ලොට් අංක 1115 2/2 දරන බිම් කට්ටිය වන උතුරට: FVP 259 පිඹුරේ ලොට් අංක 1112 ද, නැගෙනහිරට : FVP 259 පිඹුරේ ලොට් අංක 1108 ද, දකුණට : FVP 259 පිඹුරේ ලොට් අංක 1116 ද, බස්නාහිරට : FVP 259 පිඹුරේ ලොට් අංක 1115 ද යන මායිම් ඇතුළත හෙක්ටෙයාර බිංදුවයි දශම එකයි අටයි එකක (හෙ. 0.181) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙම ඉඩම නැවත මනින ලදුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනදරා කෝරළේ, අංක 246 ග්‍රාම නිලධාරි වසමේ වන්නියන් කුලම ග්‍රාමයේ පිහිටි අංක FVP 259 දරන පිඹුරේ ලොට් අංක 1115 2/2 ලෙස ලකුණු කළ බිම් කට්ටියට, බලයලත් මිනින්දෝරු ප්‍රියන්ත සමරතුංග විසින් මැන සාදන ලද අංක 2005/346 හා 2005.10.02 දින දරන පිඹුරේ විස්තර කර තිබෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : FVP 259 පිඹුරේ ලොට් අංක 1112 ද, නැගෙනහිරට : FVP 259 පිඹුරේ ලොට් අංක 1108 ද, දකුණට : FVP 259 පිඹුරේ ලොට් අංක 1116 ද, බස්නාහිරට : FVP 259 පිඹුරේ ලොට් අංක 1115 ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් තිස් එකයි දශම පහයි හයක් (අ. 0, රූ. 1, ප. 31.56) නොහොත් හෙක්ටෙයාර බිංදුවයි දශම එකයි අටයි එකක් (හෙ. 0.181) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-355/1

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 275 හා 2004 ඔක්තෝබර් 14 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 653 හා 2007 ජනවාරි 23 වැනි දින දරන බැඳුම්කරය යන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම, "බුබුල ගෘහ භාණ්ඩ වෙළඳ සැල" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස කඳුරුවෙල ව්‍යාපාරය කරගෙන යන ගී කියන ගමරාලලාගේ දොන් සරත් කුමාර ගීකියනගේ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2009 ජනවාරි 31 වන දිනට ඉහත කී අංක 275 හා 653 දරන උකස් බැඳුම්කර මත එකී ගීකියන ගමරාලලාගේ දොන් සරත් කුමාර ගීකියනගේ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පන්ලක්ෂ අසූඑක් දහස් දෙසිය හැට අටකුත් ශත හැත්තෑ හතක (රු. 5,81,268.77) මුදලක් සහ 2009 පෙබරවාරි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් ලක්ෂ හැත්තෑ තුන්දහස් හයසිය හැත්තෑ හතරක් (රු. 1,73,674) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත

පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය සහ රුපියල් දෙලක්ෂ අනූඑක් දහස් හයසිය පණස් අටක් (රු. 2,91,658) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි 1, අප්‍රියෙල් 1, ජූලි 1 සහ ඔක්තෝබර් 1 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 275 හා 653 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ජී. බී. එස්. දියාව මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 275 සහ 653 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ, හතමුණ ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් සකස් කරන ලද එෆ්. සී. පී. පො 09 දරන පිඹුරේ ලොට් අංක 50 දරන බිම් කට්ටිය නැවත බෙදීමක් වන, බලයලත් මිනින්දෝරු ආර්. බී. අබේකෝන් විසින් මැන සාදන ලද අංක 650 හා 1996.11.21 දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කළ, "බුබුල ගොඩ ඉඩම" නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරටඃ එම පිඹුරේ ලොට් අංක 1 ද, නැගෙනහිරට : පාර (එෆ්. සී. පී, පො. 09 දරන පිඹුරේ ලොට් අංක 23 හා 24) ද දකුණට : පාර (එෆ්. සී. පී. පො. 09 පිඹුරේ ලොට් අංක 57), බස්නාහිරට : පාර (එෆ්. සී. පී. පො. 09 දරන පිඹුරේ ලොට් අංක 57) සහ එෆ්. සී. පී. පො. 09 දරන පිඹුරේ ලොට් අංක 51 ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් විසිහතක් (අ. 0, රූ. 2 ප. 27) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම පොලොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම මෙහි පහත දැක්වෙන ඉඩමේ අතුරු බෙදීමක් වේ.

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ. සිංහල පත්තුවේ, අංක 66 බුබුල ග්‍රාම නිලධාරි වසමේ, හතමුණ ග්‍රාමයේ, පිහිටි අංක පො 09 දරන අවසාන කොලනි පිඹුරේ, මීට් අංක 1-3 හි ලොට් අංක 50 ලෙස ලකුණු කළ "ගොඩ" යනුවෙන් හැඳින්වෙන බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 23, 24 සහ 49 ද, නැගෙනහිරට : ලොට් අංක 23 සහ 24 ද දකුණට : ලොට් අංක 56, 57 සහ 51 ද, බස්නාහිරට : 51, 55 සහ 49 ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් විසි එකක් (අ. 1, රූ. 1, ප. 21) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලුපාර,
කොළඹ 03.

04-296

**රුහුණු සංවර්ධන බැංකුව - අගුණකොලපැලැස්ස ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.07.23 දින පවත්වන ලද රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :-

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඊ. මුණසිංහ මහතා විසින් සහතික කරන ලද 2004.05.10 දිනැති අංක 3659 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අඩි 100 පාර, රත්න ලිපිනයේ පදිංචි බදුගේ සෝමපාල/බදුගේ චමින්ද යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ දොලොස් දහසක් පමණි (රු. 2,12,000) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2006.05.21 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් දෙලක්ෂ දොලොස්දහසක (රු. 2,12,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3659 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්න නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යාය 20 නැමැති ගමේ පිහිටි අංක 328 දරන බිම් කැබැල්ල නැමති උතුරට කේ. පී. පී. රත්නසිරි පදිංචි ඉඩම ද, නැගෙනහිරට හෙන්ද්‍රික් පදිංචි ඉඩමද, දකුණට කේ. පී. නජිත් පදිංචි ඉඩමද, බස්නාහිරට අගුණකොලපැලැස්ස පාර රක්ෂිතයද මායිම් වූ අක්කර එකක් (අක්. 01, රූඩ් 0, පර්. 0) විශාල ඉඩමේ තිබෙන සියලු වැවිලි සහ ගොඩනැගිලි සමඟ බිම හා ඊට අයිති සියලු දේද වේ.

මෙම දේපල අංක වංචල 13/189 යටතේ 2004.05.10 දින හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සභාපති,
දයාරත්න පලිහක්කාර.

2008 ජූලි මස 23 වැනි දින,
රුහුණු සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන, මාතර.

04-324

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. පිනිදිය විසින් ලියා සහතික කරන ලද අංක 11154 හා 1998 ජූනි 02 දින දරන මුල් උකස් බැඳුම්කරය මත සහ අංක 12809 හා 2002 ජූනි මස 27 දින දරන තෘතියික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය මාතර, මිරිස්සේ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන, (මෙහි මින් ඉදිරියට "සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඩී. එන්. දලුවත්ත (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් සහ (මෙහි මින් ඉදිරියට "උකස්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ධර්මසිරි නන්දලාල් දලුවත්ත යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, 2008 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී ඩී. එන්. දලුවත්ත (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් සහ ධර්මසිරි නන්දලාල් දලුවත්ත යන අයගෙන්, ඉහත කී අංක 11154 සහ 12089 දරන උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස් හත් ලක්ෂ පහළොස් දහස් එකසිය තිහකුත් ශත පණස් හතක (රු. 37,15,130.57) මුදලක් සහ 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ විසිදහසක් (රු. 320,000) සඳහා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් සහ රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ දහසක් (රු. 14,70,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළ කරනු ලබන බරතැබූ මූලික ණය පොලී අනුපාතිකය (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලියද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස් හත් ලක්ෂ පහළොස් දහස් එකසිය තිහකුත් ශත පණස් හතක (රු. 37,15,130.57) මුදල සහ 2008 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන්ලක්ෂ විසිදහසක් (රු. 320,000) සඳහා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් සහ රුපියල් දහහතර ලක්ෂ හැත්තෑ දහසක් (රු. 14,70,000) සඳහා එක් එක් වර්යේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 11154 හා 12089 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 11154 හා 12089 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ දෙනිපිටියේ පිහිටි, වැලිහරණ දෙනිය වත්ත, ලොට් බී, සී, ඩී, ඊ, එෆ්. බිම් කට්ටි වල ලොට් අංක 1, දවටගහ දෙණිය සහ අලුත්දෙණිය නොහොත් වැලිහරණ දෙණිය ඉඩමේ ලොට් අංක 1, 2 සහ 3, වැලිහරණ දෙණිය වත්තේ ලොට් අංක 1 සහ බඩල්ගෙවත්ත ලොට් "ඒ " සහ ලොට් "බී" බඩල්ගෙ කුඹුර සහ බඩල්ගෙ ඕවිට ලොට් සී සහ ලොට් සී1 යන එකට යාවූ ඒකාබද්ධ ඉඩමේ, බෙදා වෙන්කළ ඒකාබද්ධ ලොට් 1 සහ ලොට් අංක 15 සිට 22 දක්වා බිම් කට්ටිවලට එක්ව මායිම් උතුරු නැගෙනහිරට මෙම ඉඩමේ ලොට් අංක 14 සහ වැලිහරණ දෙණියවත්ත ද දකුණු නැගෙනහිරට වැලිහරණ දෙණිය වත්ත ලොට් අංක 2 හා 3 සහ බඩල්ගෙවත්ත ද දකුණු බස්නාහිරට සහ බස්නාහිරට බඩල්ගේ වත්ත සහ පොල් අතු මෝදර සිට දෙණිපිටියට යන පාර ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් අටක් (අ. 1, රූ. 2, ප. 8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් මැන සාදන ලද අංක 2068 හා 1982.06.02 දින දරන පිඹුරේ දැනට නිරූපණය කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලුපාර,
කොළඹ 03.

04-355/2

---

### සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ආර්. තිස්කුමාර විසින් ලියා සහතික කරන ලද අංක 1547 හා 2007 ජූනි 27 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මාතර තෙල්මාදුව ආරච්චිගේ වසන්ත චන්ද්‍රසිරි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 නොවැම්බර් 30 වන දිනට ඉහත කී උකස් බැඳුම්කරය මත එකී තෙල්මාදුව ආරච්චිගේ වසන්ත චන්ද්‍රසිරි යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් දාහතර ලක්ෂ හතළිස් පන් දහස් හයසිය අනූඅටකුත් ශත පනස් දෙකක (රු. 14,45,698.52) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එකී රුපියල් දහහතර ලක්ෂ හතළිස් පන් දහස් හයසිය අනූ අටකුත් ශත පනස් දෙකක (රු.14,45,698.52) මුදල සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දහහතර ලක්ෂ හතළිස් පන් දහස් හයසිය අනූඅටකුත් ශත පනස් දෙකක (රු.14,45,698.52) මුදල සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එකී රුපියල් දහහතර ලක්ෂ හතළිස් පන් දහස් හයසිය අනූ අටකුත් ශත පනස් දෙකක (රු.14,45,698.52) මුදල සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1547 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ගාමිණී දියාව මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 1547 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අඳුගොඩ පිහිටි "ඇත්අඩිහේනෙවත්ත" නමැති ඉඩමේ ලොට් අංක 2 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට: අරලියගහවත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 1 ද, දකුණට: මෙම ඉඩමේ ලොට් අංක 3 ද, බස්නාහිරට : ගොඩැල්ල ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් හයක් (අක්කර 1 රූඩ් 2, පර්චස් 06) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෑතකදී සකස් කළ මැනුම් පිඹුරකට අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන ආකාරයට විස්තර කර තිබේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අඟුගොඩ පිහිටි "ඇත්අඩිහේන" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රෂ්මි විසින් මැන සාදන ලද අංක 287 හා 1992.12.31 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අරලියගහ වත්ත ද, නැගෙනහිරට : ඉබ්බාවෙල සිට අඳුගොඩට යන (ගම්සභා) පාර ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 03 ද, බස්නාහිරට: ගොඩැල්ල ද යන මායිම් ඇතුළත එකී අංක 287 දරන පිඹුර අක්කර එකකුත් රූඩ් දෙකකුත් පර්චස් හයක් (අක්කර 01, රූඩ් 02, පර්චස් 06) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 03.

04-355/3

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0400001361.

ණයකරුගේ සම්පූර්ණ නම: වල්පොලේ ගෙදර සරත් කුලතුංග සහ අත්තනායක වලව්වේ එරන්ජා ඉදුනිල් කුමාරි අබේරුවන්

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. ප්‍රේමරත්න විසින් ලියා සහතික කරන ලද 3217 හා 2000.10.20 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛණයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා( සංශෝධන) පනතින් සංශෝධිත (1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් පන්සිය අනූ අටයි ශත අසූ දෙකක (රු.252,598.82) මුදලක් වර්ෂ 2008.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ විසිතුන් දහස් හැත්තෑ පහයි ශත අසූ නවයක (රු.223,075.89) මුදලද, වර්ෂ 2008.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසි නව දහස් පන්සිය විසි දෙකයි ශත අනූ තුනක් (රු. 29,522.93) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් පන්සිය අනූ අටයි ශත අසූ දෙකක (රු. 252,598.82)

(2) එකී රුපියල් දෙලක්ෂ විසිතුන් දහස් හැත්තෑ පහයි ශත අසූ නවයක (රු.223,075.89) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2008.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා.

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස

සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 25 දින පැවැති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නව උඩු දුම්බර ගම්පහ බටහිර කෝරළේ, උඩුදුම්බර ප්‍රාදේශීය සභා සීමාවේ නුගේතැන්න නැගෙනහිර ග්‍රාමයෙහි පිහිටි කිවුල්ගම පාරේ වරිපනම් අංක 10 හි පිහිටි මිරියහින්න කෝපිවත්ත නමැති ඉඩමට 1999.05.08 දින එස්. ඒකනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 1786 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම් උතුරට: හිඟුරුමාන සිට එන පරණ පාරද, සහ සොලමන් නානායක්කාරට අයත් ඉඩමේ මායිම් නමුත් වඩාත් නිවැරදි ලෙස හිඟුරුමාන පාර සිට එන පරණ පාර ද, සහ ප්‍රධාන පාරේ සිට කිවුල්ගම දක්වා වූ අධිවේගී මාර්ගය ද නැගෙනහිරට : මිරියතැන්න පන්සල් ඉඩම ද, දකුණට : මිරියතැන්න පන්සල් ඉඩම ද, සහ බටහිරට : මිරියතැන්න පන්සල් ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම හතයි (අක්කර 0, රූඩ් 0, පර්චස් 10.75) වපසරියකින් යුත් මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවයද, සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 43/204 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-498

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0400000725.

ණයකරුගේ සම්පූර්ණ නම : රාජපක්ෂ වාලිමුනි මුදියන්සේලාගේ කිත්සිරි නිශාන්ත රත්නායක සහ ජයසුන්දර මුදියන්සේලාගේ උදේනි රත්නායක

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අසීස් සහ එම්. ආර්. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 9368 සහ 810 හා 1997.06.11 සහ 2005.10.20 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛණයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා( සංශෝධන) පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ׃

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූ දහස් හාරසිය දහයයි ශත අසූ අටක (රු.1,90,410.88) මුදලක් වර්ෂ 2008.02.29 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින් ׃

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හතළිස් අට දහස් හත්සිය හතළිස් නවයයි ශත හැට නවයක (රු.148,749.69) මුදලද, වර්ෂ 2008.02.29 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් එක් දහස් හයසිය හැට එකයි ශත දහනවයක් (රු.41,661.19) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ අනූ දහස් හාරසිය දහයයි ශත අසූ අටක් (රු.1,90,410.88)

(2) එකී රුපියල් එක් ලක්ෂ හතළිස් අට දහස් හත්සිය හතළිස් නවයයි ශත හැට නවයක (රු.1,48,749.69) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.00% බැගින් වන පොළියක් 2008.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුලුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මාර්තු මස 28 වන දින පැවැති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරළේ මහනුවර මහ නගර සීමාව තුළ ධර්මාශෝක මාවතේ බදුවත්ත පටු මාවතේ බදුවත්ත පටුමගේ පිහිටි වරිපනම් අංක 19/5 දරන ගෙදර කුඹුර වත්ත හා දෙනියේ වත්ත නමැති ඉඩමට 1994.05.19 දින ටී. බී. අත්තනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 4289 පිඹුර ප්‍රකාර කැබලි අංක 02ට මායිම් ඊසානට : එම පිඹුරේම කැබලි අංක 03 ද, ගිණිකොනට : වරිපනම් අංක 19 දරන නිවාස ස්ථානය ද, නිරිතට : එම පිඹුරේම කැබලි අංක 01 ද, වයඹට : කැබලි අංක 04 වන අඩි 10ක් පළල පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හයක (අක්කර 0, රූඩ් 0, පර්චස් 06) විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ පළතුරු ආදී සියලුදේද, සහ මාර්ග පරවශතාවයද, සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 260/39 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-499

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0404400074.

ණයකරුගේ සම්පූර්ණ නම : සමරකෝන් මුදියන්සේලාගේ කපිල සුසන්ත සමරකෝන්

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. රාජමුනි විසින් ලියා සහතික කරන ලද 1922 හා 1995.05.03 දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛණයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පන්දහස් එකසිය පහයි ශත හතළිස් නවයක (රු. 1,05,105.49) මුදලක් වර්ෂ 2008.02.29 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින් ,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස් නව දහස් පන්සිය දෙකයි හත අනූපහක (රු.59,502.95) මුදලද වර්ෂ 2008.02.29 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් පන්දහස් හයසිය දෙකයි ශත පනස් හතරක් (රු.45,602.54) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පන්දහස් එකසිය පහයි ශත හතළිස් නවයක් (රු.105,105.49) ද,

(2) එකී රුපියල් පනස් නව දහස් පන්සිය දෙකයි ශත අනූ පහක (රු.59,502.95) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.5% බැගින් වන පොළියක් 2008.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුලුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මාර්තු මස 28 වන දින පැවැති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේ ගම්පහ කෙත්ගල්ල හා පල්ලේගම්මැද්ද, අතරගල්ල පිහිටි මල්පාන වත්තට 1994.05.15 හා 1994.01.28 දින එස්. විජේරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 2684ඒ පිඹුරේ කැබලි අංක 43ට මායිම්, උතුරට : කැබලි අංක 42 සහ මල්පානවත්තෙන් දෙන ලද ගංගාතිලක විහාරයේ ඉඩම ද, නැගෙනහිරට: කැබලි අංක 44 සහ මල්පානවත්තෙන් දෙන ලද මල්පාන ගංගාතිලක විහාරයේ ඉඩම ද, ගලගෙදර පටුමගද, දකුණට : කැබලි අංක 44 සහ 46 ද, බටහිරට : කැබලි අංක 46 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහනමයක (අක්කර 0, රූඩ් 0, පර්චස් 19) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවයද සමග වේ. මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 608/210 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-501

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0400000351.

ණයකරුගේ සම්පූර්ණ නම: දිසානායක මුදියන්සේලාගේ සමන්ති මුණසිංහ සහ නිශාන්ත ධර්මසේන

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. රාජමුනි විසින් ලියා සහතික කරන ලද අංක 1670 හා 1994.07.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛණයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දහස් හාරසිය විසිපහයි ශත විසිඅටක (රු. 230,425.28) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටතුන්දහස් පන්සිය විසිනමයක (රු. 63,529.00) මුදලද වර්ෂ 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටහයදහස් අටසිය අනූ හයයි ශත විසිඅටක (රු. 166,896.28) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දහස් හාරසිය විසිපහයි ශත විසිඅටක (රු. 2,30,425.28) ද,

(2) එකී රුපියල් හැටතුන්දහස් පන්සිය විසිනමයක (රු. 63,529.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා.

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඳුපිට පත්තුවේ ඇලගල්ල ගමේ පිහිටි, මොරගහමුලහේන නමැති ඉඩම 1993.07.07 දින ඩබ්. එම්. එම්. ඒ. විජේකෝන් මානක තැන මැන සම්පාදිත පිඹුරු අංක 1669 ප්‍රකාර කැබලි අංක 08 බී ට මායිම්, උතුරට : කැබලි අංක

8 ඒ සහ ගම්සභා පාර ද, නැගෙනහිරට : එම ඉඩමේම කැබලි අංක 9 ද, දකුණට : නැකතිගේහේන සහ බටහිරට : එම ඉඩමේම කැබලි අංක 8 ඒ ද යන මායිම් තුල පිහිටි පර්චස් දහ අටයි දශම දෙකයි පහක (අ. 0, රූඩ්. 0, පර්.18.25) වපසරියකින් යුතු ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 989/206 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

04-500

---

## මහජන බැංකුව - පැලවත්ත ශාඛාව

### 1968 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පාලමණ්ඩඩිගේ රෝස් කුමාරි නිශාන්ති ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2006.08.24 දිනැති අංක 1362 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, 1. දෙවැනි ගුරුගේ තිලකරත්න මයා, 2. දෙවෙනි ගුරුගේ රපියෙල් මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අනූහය දහස් හයසිය හැට (රු. 1,96,667) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පණතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අනූහය දහස් හයසිය හැටහත (රු. 1,96,667) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 1362 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO 13/213 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරලේ මහපත්තුව දකුණේ, පැලවත්ත ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ, පැලවත්ත නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබූ ඔහු භාරයේ ඇති අංක අ. ග. සි. 112 දරන පිඹුරෙහි අංක 1381 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති අක්කර එකයි පර්චස් විසි අටක් (අක්. 01, රූඩ්.0, පර්. 28) ඇතැයි ගණන් බලා තිබෙන නාකියාගොඩහේන නමැති ඉඩමට මායිම්, උතුරට අගපි. 112 කට්ටි අංක 1376, නැගෙනිරට අගපි. 112 කට්ටි අංක 588, දකුණට අගපි 112 කට්ටි අංක 1396, බස්නාහිරට අගපි 112 කට්ටි අංක 1375 පාර මායිම් වූ ඉඩම හා එහි පිහිටි සෑම සියළු දේද, ඉඩමට ඇති සියළුම මාර්ග අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කළුතර)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
341, ගාළුපාර,
පානදුර.

04-440

---

## මහජන බැංකුව - කැස්බෑව ශාඛාව

### 1968 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 2953 සහ 2007.06.16 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මල් ශ්‍රී ධම්මික හේවාතන්ත්‍රී මහතා, අඟුලුගහ ගමගේ තමරා මල්කාන්ති හේවාතන්ත්‍රී මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2953 දරන බැඳුම්කරය මත රුපියල් දෙලක්ෂ හැටපන් දහසක (රු. 2,65,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් දෙලක්ෂ හැටපන් දහසක (රු. 2,65,000) එකී මුදල ද 2008.06.30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් තවදුරටත් වූ පොලිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 2953 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපල සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සභා සීමාව තුල "දූලන්මහර" ගමේ පිහිටියා වූ ද, "ගලබොඩලන්ද" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද අංක 7321 හා 2004.10.27 වැනි දින දරන පිඹුරේ ලොට් අංක F 6 D වශයෙන් ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : අංක 5670 පිඹුරේ (අඩි 15 පළල පාර සඳහා වෙන් කිරීම වන) ලොට් F 5 ද, නැගෙනහිරට : ලොට් F 6 E ද, දකුණට : ලොට් F 6

F ද, බස්නාහිරට : F 6 C ද මායිම් වන්නා වූද එකී අංක 7321 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අක්. 0, රූ.0, පර්.10) විශාල වූ ද ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2273/272 වෙළුමේ/පත්‍රුරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි සියලු දේත් ය.

අංක 5670 දරන පිඹුරේ (අඩි 15 ක් පළල පාර වන) ලොට් F 5 උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ අංක 7321 දරන පිඹුරේ දැක්වෙන ලොට් F 6 A (කාණුව) පිළිබඳ පොදු අයිතිය ද මීට ඇතුළත් වේ.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2273/272 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

04-442

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

1. මහජන නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2006.08.15 දිනැති අංක 784 දරන බැඳුම්කරය මත ණය මත මුල් මුදල හා 2006.09.03 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දොලොස් ලක්ෂ අසූහතර දහස් හයසිය හතලිස් අටයි ශත විසිනවයක (රු. 12,84,648/29) මුදලක් සමග රුපියල් එකොලොස් ලක්ෂ හැටපන් දහස් පන්සිය තිහයි ශත හැටනවයක (රු. 11,65,530.69) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොලියක් ද, 2008.09.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, ගමගේ සමූහ ව්‍යාපාරයේ කොටස්කරුවන් වන, හෝමාගම, ගොඩගම, සම්පත් උයන 151/2 හි පදිංචි කලිදූව විදාන ගමගේ වසන්ත දුමින්ද මහතා සහ කොට්ටාව මත්තේගොඩ, පොල්ගස්ඕවිට, නාමල් උයන 127/23 හි පදිංචි කලිදූව විදානගමගේ පියදාස මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 784 දරන බැඳුම්කරය මත අයවිය යුතු ඉහත 1 හි සඳහන් මුදල සමග ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර T & H ඔක්ෂන්ස් මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උකස් බැඳුම්කරයේ සඳහන් උපලේඛණය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, ගොඩගම ග්‍රාමයේ පිහිටි අවිස්සාවේල්ල පාරේ, දැනට වරිපනම් අංක 615 (කොටස) දැන් 611 දරන බලයලත් මිනින්දෝරු එල්. වික්‍රමරත්න විසින් සාදන ලද 2002 නොවැම්බර් 24 දිනැති අංක 825 දරන පිඹුරෙහි ලොට් 30බී ලෙස දක්වා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල සහ එහි ඇති ගොඩනැගිල්ලද සහිතව එකී ලොට් 30බී උතුරට : අංක 825 දරන එම පිඹුරෙහිම දක්වා ඇති ලොට් 30ඒ ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : හයිලෙවල් පාර ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1980 මැයි 28 දිනැති අංක 2145 දරන පිඹුරෙහි දක්වා ඇති ලොට් 13 ද මායිම්ව ඉහත කී අංක 825 දරන පිඹුරට අනුව පර්චස් දහඅට (අ.0, රූ.0, පර්.18) හෙක්ටයාර් 0.0455 ක වපසරියකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1409/150 ඒ හි ලියාපදිංචි කර ඇත.

තවද, මේ සමගම එයට දක්වා ඇති පාරේ අයිතිය ද වේ.

ඉහත කී ගොඩගම ග්‍රාමයේ පිහිටි එකී අංක 825 දරන පිඹුරෙහි ලොට් 30ඒ (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එකී ලොට් 30ඒ උතුරට : ලොට් සී පාර ද, නැගෙනහිරට: පාරෙන් ද, දකුණට : ලොට් 30බී ද, බස්නාහිරට : ලොට් 31 ද මායිම් ව ඉහත කී අංක 825 දරන පිඹුර ප්‍රකාර පර්චස් දශම හතයි බිංදුවක (අ.0, රූ.0, පර්.70) හෙක්ටයාර් 0.0018 ක පවසරියකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කර්යාලයේ ජී 1409/150 බී හි ලියාපදිංචි කර ඇත.

සී. ඩබ්. වෙලගෙදර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
නුගේගොඩ.

04-420

---

**මහජන බැංකුව - මහරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන මහතා විසින් සහතික කරන ලද 2005.12.06 වැනි දිනැති අංක 1869 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, මොරපොලවත්තගේ කිසෝ කුමාර් මයා, මොරපොලවත්ත හුලවාලීන්ගේ සේනාරත්න විල්ලියා මයා යන අයවළුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අනූඑක් දහස් එකසිය හයයි ශත විසිතුනක (රු. 1,91,106.23) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.14 වැනි දින සිට වර්ෂයකට 18% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අනූඑක් දහස් එකසිය හයයි ශත විසිතුනක (රු. 1,91,106.23) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත්

වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක 1869 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරලේ පන්නිල් පත්තුවේ බුංගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බුංගිරිය ගමේ පිහිටි අංක 11 දරන අවසාන ගම් පිඹුරේ සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අතිරේක අංක 2 පත්‍ර අංක 6 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 35657 දරන පිඹුරේ අංක 88 2/2 දරන "නියංගමලේ හේන්යාය" නමැති ඉඩමට උතුරට : කැබලි අංක 88 1/2 හා 66 ද, නැගෙනහිරට : කැබලි අංක අංක 66 ද, දකුණට : කැබලි අංක 91 ද, බස්නාහිරට කැබලි අංක 87 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි දෙකක් (හෙක්ටයාර් 0.202) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි සියලුම දේ ද වේ.

මෙය දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජයභූමි/ඉසං 17/403 දරන පත්ඉරු යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
සබරගමු කලාපය.

මහජන බැංකුව,
සබරගමුව කලාප කාර්යාලය,
නව නගරය, රත්නපුර.

04-441

---

## මහජන බැංකුව - මහරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.30 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2007.08.23 වැනි දිනැති අංක 2808 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, ජයවීර මුහන්දිරම්ගේ චමින් ගයනාත් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ හැත්තෑ දහසක (රු. 4,70,000) මුදලක් හා ලක්ෂතුනක (රු. 3,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.09.23 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් හා 2008.12.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ "29එල්" 29L වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ හැත්තෑදහසක් (රු. 4,70,000) හා රුපියල් ලක්ෂ තුනක් (රු. 300,000) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 2808 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, උඩුගහ පත්තුවේ සිද්ධමුල්ල යන ගම පිහිටි "අලුබෝගහවත්ත" නොහොත් "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එන්. පී. ඇල්විටිගල මහතාගේ වර්ෂ 2006.12.17 වැනි දිනැති අංක 2810 දරන පිඹුර ප්‍රකාරව, කැබලි අංක 1 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 3392 දරන පිඹුරේ කැබලි අංක සී 1 ඒ දරන කැබැල්ල සහ සීමන් පීරිස් සහ තවත් අය සතු ඉඩම ද, නැගෙනහිරට : එච්. සීමන් පීරිස් සහ තවත් අය සතු ඉඩම ද, දකුණට : කැබලි අංක 2 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 3392 දරන පිඹුරේ කැබලි අංක සී1බී දරන පාර ද යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් අටක් (අක්.0, රූඩ්.0, පර්.08) ක් විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

*මාර්ග අයිතිය සඳහා* : ඉහත කී සිද්ධමුල්ල යන ගම පිහිටි "අලුබෝගහවත්ත" නොහොත් "දෙල්ගහවත්ත" නමැති ඉඩමේ වරලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න මහතාගේ වර්ෂ 2001.11.18 වැනි දිනැති අංක 3392 දරන පිඹුරේ ප්‍රකාරව කැබලි අංක සී1බී දරන මාර්ගය වන, උතුරට : කැබලි අංක සී 1 ඒ දරන කැබැල්ල ද, නැගෙනහිරට කැබලි අංක සී1සී දරන කැබැල්ල ද, දකුණට : පාර ද, බස්නාහිරට කැබලි අංක ඩී දරන එස්. පෙරේරා සතු ඉඩම ද, යන මායිම් තුල පිහිටි පර්චස් තුනයි දශම හයක් (අක්. 0, රූඩ්. 0, පර්.3.60) විශාල මාර්ගයේ මාර්ග අයිතියත් සමඟ වේ.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන්. 387/55 හා 355/226 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප 11)

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (පිටත), මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

04-439

---

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ණය අංක : 603080335752

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.04.30 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී මෙහි පහත දැක්වෙන යෝජනාව,

විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත වූ, පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. චම්පා අමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 5492 හා 2006.08.08 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම උකස්කරු වන අංක 308/එෆ්, ගලහිටියාව දකුණ, ගනේමුල්ල පදිංචි කාග්ගොඩ ආරච්චිගේ තමරා කුමාරි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2008.05.08 වැනි දිනට රුපියල් දහතුන් ලක්ෂ හතලිස් දෙදහස් තුන්සිය අනූ තුනයි ශත පනස් දෙකක (රු. 13,42,393.52) මුදල සහ 2006.08.08 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා ඒ සඳහා පොලියද, ප්‍රචාරක වියදම් ද, දරන ලද වෙනත් ගාස්තු ඇත්නම් එම ගාස්තු හා සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකර ගත හැකි මුදලද ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල්ද අඩුකොට අයකර ගැනිම සඳහා ඉහත කී අංක 5492 උකස් බැඳුම්කරය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත උකස් කර ඇති මෙහි උපලේඛණයේ සවිස්තරව විස්තර කරන දේපල හා පරිශ්‍රය, ප්‍රසිද්ධ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් හා සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත වූ පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් යෝජනා සම්මත කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුව තුල මහර ප්‍රාදේශීය සභා සහ නාරංවල උප කාර්යාල සීමාව තුල පිහිටි කිරිල්ලවල පිහිටි බටදොඹගහ වත්ත සහ මිල්ලගහවත්ත යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 2005.07.08 දිනැති අංක 737/2005 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් විස්ස (අක්.0, රූ.0, පර්.20) ක විශාලත්වයක් ඇති ලොට් අංක “ඒ ” නැමැති ඉඩමට මායිම් උතුරට : කීර්ති බණ්ඩාරගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : ආර්. පී. රූපසිංහගේ ඉඩමෙන් ද, දකුණට: ආර්. පී. රූපසිංහගේ ඉඩමෙන් ද, බටහිරට : මාර්ගයෙන් ද යන මායිම් ඇතුලත පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 684/264 (සටහන් තීරුවේ) යටතේ ලියාපදිංචි වී ඇත.

කළමණාකරු (ණය).

ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
අංක 255, ගාලුපාර,
කොළඹ 03.

04-455

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 367746.

2008 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී:

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ ද, 2004 ජූලි මස 20 වැනි දින හා අංක 7152 සහ 2007 මැයි මස 28 වැනි දින අංක 9399 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශාසෙත්‍රාදය ප්‍රින්ටිංග් වර්ක්ස් යන නාමය හා විලාශය යටතේ හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ශිරාල් දුමින්ද වන්නිආරච්චි සහ දයානන්ද සිරිමෙවන් වන්නිආරච්චි ණයකරුවන්/උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය අනූනව ලක්ෂ අනූහතර දහස් එකසිය එකයි ශත අනූ එකක (රු.1,99,94,101.91) මුදලක් 2008 ජූලි මස 13 වැනි දින වන විට කොමර්ෂල් බැන් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකසිය අනූනව ලක්ෂ අනූහතර දහස් එකසිය එකයි ශත අනූ එකක (රු. 1,99,94,101.91) මුදලට 2008 ජූලි මස 14 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 16,444,000 ක මුදල මත 21% ක වැඩිපුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 7152 සහ 9399 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

1. බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සහ 1981 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ, කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරළේ දකුණ, කුලියාපිටිය නගර සභා සීමාව තුල කුලියාපිටිය පිහිටි මාබෙල් ගාඩ්න්ස් කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 11 දරන ඉඩම් කොටසට මායිම් උතුරට සහ නැගෙනහිරට අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද ලොට් 7 ද, දකුණට එකී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 17 ද, බස්නාහිරට එකී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 15 සහ 12 ද යන මායිම් තුල පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 0, පර්.22) විශාල ඉඩම් සහ භූමිය ගසකොළ, වගාවන්, ඡායාරූප කර්මාන්තය සඳහා වූ ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ සහ ඊට අයිති වන සියළු දේත් සමඟ වේ. තවද අංක 3223/ඒ දරන පිඹුරේ අඩි 20 ක් පළල පාරක් සඳහා

වෙන්කොට ඇති ලොට් අංක 7 දරන කොටසේ දියුණු කිරීම, නඩත්තු කිරීම සහ භාවිතා කිරීමේ අයිතිය ද සමඟ වේ. කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ “ජේ” කොට්ඨාසයේ 143 වෙළුමේ 205 පිටුවේ ලියාපදිංචිව ඇත.

2. බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සහ 1981 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල යටිකහ කොරලේ, දකුණ කටුගම්පොල, හත්පත්තුවේ, කුලියාපිටිය නගර සභා සීමාව තුල කුලියාපිටිය පිහිටි මාබෙල් ගාඩ්න්ස් කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 15 දරන ඉඩම් කොටසට මායිම් උතුරට අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 14, 13 සහ 12 ද, නැගෙනහිරට අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් 11 සහ 17 ද, දකුණට අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 16 ද, බස්නාහිරට මිහිදු මාවත ද යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්. 20) විශාල ඉඩම් සහ භූමිය ගසකොළ, වගාවන්, ඡායාරූප කර්මාන්තය සඳහා වූ ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ ඊට අයිති වන සියළු දේත් සමඟ වේ. එකී ඉඩම කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිවි කිරීමේ කාර්යාලයේ "ජේ" කොට්ඨාසයේ 144 වෙළුමේ 131 පිටුවේ ලියාපදිංචිව ඇත.

3. බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සහ 1981 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල යටිකහ කොරලේ, දකුණ කටුගම්පොල, හත්පත්තුවේ, කුලියාපිටිය නගර සභා සීමාව තුල කුලියාපිටිය පිහිටි මාබෙල් ගාඩ්න්ස් කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 16 දරන ඉඩම් කොටසට මායිම් උතුරට අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 15 ද, නැගෙනහිරට අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් 17 ද, දකුණට පාර ද, බස්නාහිරට මිහිදු මාවත ද යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්. 20) විශාල ඉඩම් සහ ඒ තුළ පිහිටි භූමිය ගසකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ සියළු දේත් සමඟ වේ. මෙය කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජේ" කොට්ඨාසයේ 144 වෙළුමේ 130 පිටුවේ ලියාපදිංචි ව ඇත.

4. බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සහ 1981 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල යටිකහ කොරලේ, දකුණ කටුගම්පොල, හත්පත්තුවේ, කුලියාපිටිය නගර සභා සීමාව තුල කුලියාපිටිය පිහිටි මාබෙල් ගාඩ්න්ස් කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 17 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : එකී අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 11 ද, නැගෙනහිරට : එකී අංක 3223/ඒ දරන පිඹුරේ අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද ලොට් 7 ද, දකුණට : පාර ද, සහ බස්නාහිරට : අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 16 සහ ලොට් 15 ද යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් සහ ඒ තුළ පිහිටි භූමිය ගසකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ සියළු දේත් සමඟ වේ. මෙය කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිවි කිරීමේ කාර්යාලයේ "ජේ" කොට්ඨාසයේ 144 වෙළුමේ 132 පිටුවේ ලියාපදිංචිව ඇත.

5. බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බෙනට් රෙජිනෝල්ඩ් විසින් 1981 අගෝස්තු මස 18 වැනි දින සහ 1981 ඔක්තෝබර් මස 11 වැනි දින සාදන ලද අංක 3223/ඒ දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුල යටිකහ කෝරලේ, දකුණ කටුගම්පොල, හත්පත්තුවේ, කුලියාපිටිය නගර සභා සීමාව තුල කුලියාපිටිය පිහිටි මාබෙල් ගාඩ්න්ස් කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද අංක 3223/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 14 දරන ඉඩම් කොටසට මායිම් උතුරට පොදු පාරක් වන ලොට් 7 ද, නැගෙනහිරට එකී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 13 ද, දකුණට එකී අංක 3223/ඒ දරන පිඹුරේ ලොට් 15 ද සහ බස්නාහිරට මිහිඳු මාවත ද, යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්. 20) විශාල ඉඩම් සහ ඒ තුළ පිහිටි භූමිය ගසකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ සියළු දේත් සමඟ වේ. මෙය කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ජේ" කොට්ඨාසයේ 143 වෙළුමේ 81 පිටුවේ ලියාපදිංචි ව ඇත.

ආර්. ආර්. දුණුවිල,
සමාගම් ලේකම්.

04-475

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

A3 - B 80005